ජාතිකමැණික්සහස්වර්ණාභරණඅධිකාරිය

වාර්ෂික වාර්තාව

2018

දැක්ම ප්‍රකාශනය

"ශ්‍රී ලංකාව කුරුවින්ද අගනුවර බවට පත් කිරීම"

මෙහෙවර ප්‍රකාශනය

ජාතික ධනය සහ කර්මාන්තයේ කොටස්කරුවන්ගේ ප්‍රසාදය ඇතිකිරීම සදහා මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ප්‍රවර්ධනය සහ නීති ගත කිරීම තුලින් කර්මාන්තයේ විශිෂ්ඨත්වය ලඟා කර ගැනීම.

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

ව්‍යවස්ථාපිත තොරතුරු

ප්‍රධාන කාර්යාලය	-	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අංක.25, ගාළු මුවදොර කොළඹ 03. දුරකථන: 011-2329295/2325364/2390645-8 ෆැක්ස් : 011-2320758 වෙබ් පිටුව : www.ngja.gov.lk
ප්‍රාදේශීය කාර්යාල ලිපිනයන් සහ දුරකථන අංක		
ප්‍රාදේශීය කාර්යාලය (කොළඹ)	-	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අංක25, ගාළු මුවදොර කොළඹ 03. දුරකථන: 011-2325364, 2329295, 2390645, 2390651 ඊ මේල් : ngjacolr@gov.lk
ප්‍රාදේශීය කාර්යාලය (රත්නපුර)	-	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය රත්නපුර. දුරකථන : 0452223591, 0452222159, 0452223592 ඊ මේල් :srmratnapura@gov.lk
ප්‍රාදේශීය කාර්යාලය (ඇහැළියගොඩ)	-	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ප්‍රාදේශීය කාර්යාලය ඇහැළියගොඩ දුරකථන: 0362258170 ඊ මේල් :ngjaehe@gov.lk
ප්‍රාදේශීය කාර්යාලය (නාඋල)	-	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය නාඋල දුරකථන: 0662246094 ඊ මේල් : ngjanaula@gov.lk
ප්‍රාදේශීය කාර්යාලය (මොණරාගල)	-	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය 1/17, කච්චේරිය පාර, මොණරාගල දුරකථන: 0552276124 ඊ මේල් :ngjamonr@gov.lk
ප්‍රාදේශීය කාර්යාලය (මාතර)	-	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අංක : 391, පඹුරණ, මාතර දුරකථන: 0412223330 ඊ මේල් : ngjamatara@gov.lk

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය 2018 වර්ෂය

	නම		සිට	දක්වා
1	වෛද්‍ය ඩී. එම්. ඩී. ඕ. කේ.දිසානායක මහතා - සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	සභාපති	2018.01.01	2018.05.01
2	පේෂල ජයරත්න බණ්ඩාර මහතා - සභාපති, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	සභාපති	2018.05.09	2018.12.31
3	ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මහතා - විනිමය පාලක, ශ්‍රී ලංකා මහ බැංකුව	සාමාජික	2018.01.01	2018.12.31
4	නවරත්න බණ්ඩාර අලහකෝන් මහතා - සභාපති, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය	සාමාජික	2018.01.01	2018.12.31
5	ඉන්දිරා මල්වත්ත මෙනෙවිය - සභාපති, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය	සාමාජික	2018.01.01	2018.12.31
6	එච්.පී. ජයනන්ද මහතා	සාමාජික	2018.01.01	2018.12.31
7	එම්.ඒ.එස්. වීරසිංහ මහතා	සාමාජික	2018.01.01	2018.12.31
8	රංජිත් අශෝක මහතා	සාමාජික	2018.01.01	2018.11.01
9	ඒන්. තරංග සමරවික්‍රම මහතා	සාමාජික	2018.01.01	2018.03.01
10	අර්නි කිතුල්ගොඩ මහතා	සාමාජික	2018.01.01	2018.12.31
11	හපුතන්ත්‍රී ධර්මසේන මහතා	සාමාජික	2018.01.01	2018.12.31
12	ජයන්ත සෝමසිරි මහතා	සාමාජික	2018.01.01	2018.12.31
13	ජනක රණවක මහතා	සාමාජික	2018.01.01	2018.03.21
14	ඒච්.ඩී.ආර්.ඒස්. නානායක්කාර මහතා	සාමාජික	2018.05.24	2018.12.31
15	සරත් ආනන්ද මහතා	සාමාජික	2018.05.24	2018.12.31
16	කේ.ඩී. චිත්‍රපාල මහතා	සාමාජික	2018.11.05	2018.12.31

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය
2018 වර්ෂය

	නම		තනතුරු නාමය
1	පේෂල ජයරත්න මහතා	**BA(Hons). M Phill**	සභාපති, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
2	ඒච්.පී. සුමනසේකර මහත	**SLAS**	අධ්‍යාක්ෂ ජනරාල්
3	කේ.එල්.ඩී.දයාසාගර මහතා	**M.Sc. (**පේරාදෙණිය විශ්ව විද්‍යාලය**) FGA(**ලන්ඩන්**), D.Gem.G (**ජර්මනි**) MCA (**ශ්‍රී ලංකාව**)**	අධ්‍යාක්ෂ (තක්සේරු හා මැණික් විද්‍යාව)
4	ටී.ඩී. කුලනන්ද මහතා	**B.Sc. (** රාජ්‍ය පරිපාලන**)**	අධ්‍යාක්ෂ (බලාත්මක කිරීම් හා ප්‍රාදේශීය සංවර්ධන)
5	ඒ.එන්.බී.පෙරේරා මහත්මිය	**ACA, FMAAT**	අධ්‍යාක්ෂ (මුදල්)
6	එස්.ඒ.ටී. බණ්ඩාර මහතා	**B.Sc., M.I.Chem C,PGD (Gemmology)**	අධ්‍යාක්ෂ (මාත්තු බැලීම් සහ තත්ත්ව මුද්‍රා)
7	පී.ඒ.කේ. තේනුවර මහතා	**MPM, B.com(sp), HNDA, FMAAT**	අධ්‍යාක්ෂ (මානව සම්පත් හා පරිපාලන)
8	ජී. ඩබ්. අමරසිරි මහතා	**B.Sc. Eng (Mining) IESL (AM)**	අධ්‍යාක්ෂ (ඉඩම්, මැණික් ගැරීම්, පරිසර)

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ 2018 වසර සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව

01. 2018 වසර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 24 වන වසර සනිටුහන් කරයි. සමාලෝචිත වර්ෂය තුල එහි කාර්ය භාරය මෙහෙයවන ලද්දේ කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය හා රත්නපුරය, ඇහැලියගොඩ, මාතර, නාවුල සහ මොණරාගල ප්‍රාදේශීය ඒකක මෙන්ම කටුනායක මැණික් අපනයන මධ්‍යාස්ථානය සහ ලෝක වෙළඳ මධ්‍යාස්ථානයේ පිහිටුවා ඇති මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යාස්ථානය මගිනි.

02. <u>අධිකාරියේ කර්තව්‍යයන්</u>

(අ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යෝජනා කිරීම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුලත හෝ ඉන් පිටත හෝ මැණික් හා ස්වර්ණාභරණ සඳහා වූ වෙළඳපොළ පුළුල් කිරීම සහ මැණික් හා ස්වර්ණාභරණ සඳහා ලෝක වෙළඳපොලේ ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම;

(ඈ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් එම කර්මාන්තවලට අදාල සෑම අංශයකම සේවක පිරිස් වලට කාර්මික පුහුණුව, විශේෂයෙන් තාපයෝජනය සහ මැණික් කැපීම පිළිබඳව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම;

(ඉ) අනාගත ගැණුම්කරුවන් තුල මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය වියහැකි පියවරයන් ගැනීම;

(ඊ) නීති විරෝධි මැණික් ගැරීම සහ නීති විරෝධි ලෙස මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම වැලැක්වීම;

(උ) පතල් කැණීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම් යම් ආරක්ෂා කිරීමක් හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් රජය වෙත රැඳී ඇති අවස්ථාවල රජයේ ඉඩම්වල හෝ ඒ මත හෝ රජය විසින් හෝ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් බැහැර කරන ලද ඉඩම්වල හෝ ඒ මත මැණික් පතල් කැණීමේ අයිතිවාසිකම් අන්සතු කරදීම පිළිබඳව වගකිවයුතු එකම බලධරයා වශයෙන් ක්‍රියා කිරීම;

(ඌ) මැණික් හා ස්වර්ණාභරණ අලෙවි කිරීමට අවශ්‍ය කාර්මික සහ වෙනත් උපදෙස් සහ යටිතල පහසුකම් සැපයීම;

(එ) යම් උපලේඛන ගත ලිඛිත නීතියක් යටතේ පාලනය සඳහා පමණක්,

i එය මැණික් හෝ මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් අදාල වනතාක් දුරට,

හෝ

ii මේ පනත යටතේ අධිකාරියේ බලතල. කර්තව්‍ය සහ කාර්යය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනතාක් දුරට එම නීතියේ කාර්ය පරිපාලනය කිරීම;

(ඒ) මැණික් සහ වටිනා ලෝහ වර්ග සහතික කිරීම සඳහා කාර්යාල පිහිටුවීම:

(ඔ) නිෂ්පාදිතයකුගේ ඉල්ලීම පිට, සපයනු ලබන ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ නියමිත ආකාරයකට විශේෂ ලකුණකින් මුද්‍රා තබන බවට වගබලා ගැනීම;

(ඕ) ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය සහ රජයේ දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගුම හා එම සම්බන්ධීකරණ ක්‍රියාදාමයන් තවදුරටත් වර්ධනය කිරීමේ අතරමැදියා වශයෙන් කටයුතු කිරීම;

(ක) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ සේවා නියුක්තයන්ගේ සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සහ විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත සහ ශරීරාංග අනතුරු වලින් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවරයන් ගැනීම සහ ඒවා විධිමත් කිරීම සහ පාලනය කිරීම;

03. මුල්‍යය

3.1 ද්‍රවශීලතාවය :

වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ රුපියල් මිලියන 74.351 ක්වු අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 57.275 ක් විය. කල්පිරීමේ ආයෝජන (භාණ්ඩාගාර බිල්පත්) වල වසර ආරම්භයේදී රුපියල් මිලියන 567.55ක් වු අතර එය වසර අවසානයේදී රුපියල් මිලියන 800.188ක් විය.

වර්ෂය ආරම්භයේදී අනිකුත් මුල්‍ය වත්කම් වටිනාකම රුපියල් මිලියන 643.29ක් වු අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 708.104ක් විය.

3.2 ලාභදායකත්වය :

	2013 රුපි.මිලි.	2014 රුපි.මිලි.	2015 රුපි.මිලි.	2016 රුපි.මිලි.	2017 රුපි.මිලි.	2017 රුපි.මිලි.
මුළු අදායම	507.542	679.815	780.370	698.155	665.818	588.609
මුළු වියදම	387.458	364.873	458.385	510.950	536.971	442.051
ලාභය (බදුවලටපෙර)	120.084	314.942	321.985	187.205	128.847	146.558

04. **මානව සම්පත්**:

2018 වසර අවසානයේදී අධිකාරියෙහි කාර්ය මණ්ඩලය වෘත්තිකයන්ද ඇතුළුව 258 ක් විය. අඛන්ඩ වෘත්තීයමය සංවර්ධනය ඉහල ප්‍රමුඛස්ථානයේලා සලකනු ලබන අතර. කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා වර්ෂය තුල රුපියල් මිලියන 1.104 ක පිරිවැයක් දරා තිබුණි.

05. **බලපත්‍ර නිකුත් කිරීම :**

මැණික් කර්මාන්තය සඳහා අධිකාරියෙහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පසුගිය වසර පහක සංඛ්‍යා සමග සසඳා පහත දැක්වේ.

	2013	2014	2015	2016	2017	2018
මැණික්ගැරීමේබලපත්‍ර	6,565	5,928	5,151	5,240	4,817	5,532
මැණික් වෙළද බලපත්‍ර	4,429	4,714	4,619	6,102	5,328	4,795
මැණික් කැපීමේ බලපත්‍ර	192	199	204	243	225	211
මැණික් වෙන්දේසි බලපත්‍ර	624	578	543	491	461	415
බලපත්‍ර **එකතුව**	**11,810**	**11,419**	**10,517**	**12,076**	**10,831**	**10,953**

06. **අනවසර මැණික් ගැරීම් සහ පාරිසරික හාණි පාලනය** :

අනවසර මැණික් ගැරීම් සහ ඒ තුලින් සිදුවන පාරිසරික විනාශයන් මැඩපැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියෙහි නිලධාරීන් වැටලීම් ගණනාවක් සිදුකරන ලදී. දඩගැසීම් තුලින් රුපියල් මිලියන 17.323 ක ආදායමක් උපයා ගන්නා ලදී. අත්හැරදමා තිබූ මැණික් පතල් වසා දැමීමට හා හාණියට පත් ගංගා ඉවුරු පුනරුත්ථාපනය කිරීමට අධිකාරිය විසින් රුපියල් මිලියන 13.402 ක පිරිවැයක් දරන ලදී.

07. **විශේෂ මැණික් ගැරීමේ ව්‍යාපෘති**

වර්ෂය තුලදී හත්දූවවත්ත, උඩවලව සහ බඩල්කුඹුර මැණික් ගැරීමේ විශේෂ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලද අතර ඉන් රුපියල් මිලියන 25.929 ක අදායමක් උපයා ගන්නා ලදී.

08. **සේවා සහ අනිකුත් සංවර්ධන කාර්යයන්**:

1. පහත සඳහන් තෝරාගත් ජ්‍යාතන්තර වෙළද පොලවල් සහ ප්‍රදර්ශනයන්හිදී "ශ්‍රී ලංකා මණ්ඩපය" සඳහා අනුග්‍රහය දැක්වීම සහ සංවිධානය කිරීම
   - i. ජාත්‍යන්තර ස්වර්ණාභරණ ටෝකියෝ ප්‍රදර්ශනය - ජපාන(IJT) -2018 ජනවාරි 24 සිට 27 දක්වා
   - ii. හොංකොං ජාත්‍යන්තර දියමන්ති, මැණික් සහ මුතු ප්‍රදර්ශනය 2018 පෙබරවාරි 16 සිට 18 දක්වා
   - ii. JCK ලාස්වේගාස් ප්‍රදර්ශනය (U.S.A.) 2018 ජුනි 01 සිට 06 දක්වා
   - iv. මුනිච් ප්‍රදර්ශනය - ජර්මනිය - 2018 ඔක්තෝබර් 26 සිට 28 දක්වා
   - v. චීන ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - බීජිං 2018 දෙසැම්බර් 13 සිට 17 දක්වා

vi. දකුණු සහ නිරිත දිග ආසියා වෙළඳ භාණ්ඩ හුවමාරුව සහ ආයෝජන වෙළඳ පොල - 2018 ජුනි 14 සිට 20 දක්වා

vii. 15 වන CAXPO Naning 2018 සැප්තැම්බර් 12 සිට 15 දක්වා

viii. ලන්ඩන් ජාත්‍යයන්තර ස්වර්ණාභරණ - 2018 සැප්තැම්බර් 02 සිට 04 දක්වා

ix. ශ්‍රී ලංකා සහභාගීත්වයෙන් චීන ජාත්‍යන්තර ආනයන අපනයන (China international Import Expo) ෂැංහයි - 2018 නොවැම්බර් 05 සිට 10 දක්වා

2. විදේශ රටවලින් මෙරටට පැමිණෙන නියෝජිතයන් හට පහසුකම් සැපයීම

   i. නිපොන් මාරු නැව 2018 –2018 පෙබරවාරි 16

   ii. ශ්‍රී ලංකාවට පැමිණි මියන්මාර් නිලධාරීන් සහ වෙළඳ නියෝජිතයින් - 2018 මාර්තු 29

   iii. ජපන් වෙළඳ නියෝජිතයින්ගේ පැමිණීම - 2018 ජුනි

3. දේශීය වෙළඳ පොලවල් සහ ප්‍රදර්ශන සඳහා "ජා.මැ.ස්.අ.මණ්ඩපය " මගින් සංවිධානය හා අනුග්‍රහය දැක්වීම.

   i. ආයු ලංකා ප්‍රදර්ශනය -2018 පෙබරවාරි 16 සිට 18 දක්වා

   ii. කොළඹ මානලියන් සතිය ප්‍රදර්ශනය -2018 මාර්තු 21 සිට 22 දක්වා

   iii. "දිදුල ප්‍රභා" අධ්‍යාපනික ප්‍රදර්ශනය - 2018 මාර්තු 20 සිට 22 දක්වා

   iv. සිරිමාවෝ බණ්ඩාරනායක පොලොන්නරුව විද්‍යාලයේ පැවති විද්‍යා හා අධ්‍යාපනික ප්‍රදර්ශනය - 2018 මාර්තු 07 සිට 08 දක්වා

   v. අවුරුදු එක්ස්පෝ ප්‍රදර්ශනය - 2018 ජුලි 13 සිට 15 දක්වා

   vi. ශ්‍රී ලංකා ව්‍යවසායක වී 2020 (V2020) - 2018 ජූලි 29 සිට අගෝස්තු 31 දක්වා

   vii. ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය අධ්‍යාපනික ප්‍රදර්ශනය - 2018 අගෝස්තු 10 සිට 14 දක්වා

   viii. ෆැසෙට් (Facets) ශ්‍රී ලංකා ජාත්‍යන්තර ප්‍රදර්ශනය - 2018 අගෝස්තු 30 සිට සැප්තැම්බර් 02 දක්වා

   ix. 20 වැනි සංවත්සර අධ්‍යාපනික ප්‍රදර්ශනය - ලීඩ්ස් ජාත්‍යන්තර පාසැල 2018 ඔක්තෝබර් 25 සිට 26 දක්වා

   x. ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - 2018 නොවැම්බර් 17 සහ 18 දිනයන්

   xi. රිදී ජුබිලි ජනාධිපති සම්මාන උළෙල - 2018 නොවැම්බර් 23

4. කර්මාන්තයේ නියැලෙන පාර්ශවකරුවන් දැණුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා මෙහෙයවීම.

5. ග්‍රාමීය ප්‍රදේශ පදනම් කර ගනිමින් සුළු හා මධ්‍යම ප්‍රමානයේ ස්වර්ණාභරණ නිෂ්පාදකයින්හට ස්වර්ණාභරණ නිපදවීමේ ආයුධ සහ උපකරණ ලබාදීම.

6. බැංකු කරුවන් සහ පුද්ගලික ආයතන වල රත්තරන් ආනයනය කිරීමේදී මෙහෙයවිම සහ පහසුකම් සැපයීම.

7. මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රජාවට ඔවුන්ගේ යන්ත්‍ර උපකරණ සහ අමුද්‍රව්‍ය මිලදීගැනීමේදී අවශ්‍ය විදේශ ව්‍යවහාර මුදල් (ඇමරිකන් ඩොලර් 50,000 ටඅඩු) නිර්දේශ ලිපි නිකුත් කිරීම සහ මෙහෙයවීම.

8. මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන විදේශීය ව්‍යාපාරික ආයතන සහ පුද්ගලයින්ගේ ඉල්ලීම මත ඔවුනට ශ්‍රී ලංකාවේ රැඳී සිටීමට අවශ්‍ය වීසා ලබාගැනීමට සහ වීසා අලුත් කරවා ගැනීමට නිර්දේශිත ලිපි අදාල අමාත්‍යාංශය වෙත නිකුත් කිරීම.

9. ශ්‍රී ලාංකික මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ නියුතුවුවන් හට වීසා ලබාගැනීමේ ක්‍රියාවලියේදී අදාල රටවල් වල විසා නිලධාරීන් වෙත විසා ලිපි නිකුත් කිරීම.

10. ශ්‍රී ලංකාව තුල රාජ්‍ය අනුග්‍රහය මත පවත්වාගෙන යනු ලබන මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ සංකීර්ණ සඳහා "ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරුව" මගින් පහසුකම් සැපයීම සහ ප්‍රවර්ධනය කිරීම.

11. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේදී භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය, ආයුධ, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීමේදී සහන බදු අනුපාතයන් යටතේ ආනයනයට සහායවීම.

12. රාජ්‍ය සහ පුද්ගලික අංශයේ නියෝජිතයන් හට ඔවුන්ගේ මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත රාජකාරි හෝ ව්‍යාපාරික දූත ගමන් වලදී පහසුකම් සැපයීම.

13. ජාත්‍යන්තර සගරාවලට දැන්වීම් සැපයීම

- සෙරන්ඩිබ් සගරාව
- ජේඑන්ඒ (JNA)

09. **මැණික් හා ස්වර්ණාභරණ අපනයනය** :

පසුගිය වසර පහක සහ සමාලෝචිත 2018 වසර තුල ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය පිළිබඳ තත්ත්වය පහත දැක්වෙන සංඛ්‍යා මගින් නිරූපනය වේ**.**

	2013 රු මිලි.	2014 රු මිලි.	2015 රු මිලි.	2016 රු මිලි.	2017 රු මිලි.	2018 රු මිලි.
මැණික් අපනයන	14,805	19,014	18,898	19,044	21,644	22,304
මැණික් - NSS විශේෂ ව්‍යපෘතිය	1,975	3,179	2,792	1,813	-	-
ස්වර්ණාභරණ අපනයන	2,194	2,467	2,192	2,240	2,331	2,062
ගෙවුඩ අපනයනය	122	140	102	103	33	19
දියමන්ති ප්‍රතිඅපනයනය	37,885	25,633	19,790	14,967	14,134	19,393
දියමන්තිආභරණ අපනයනය	229	258	315	243	207	190
මුළු අපනයනය	**57,210**	**50,691**	**44,089**	**38,410**	**38,349**	**43,968**

රෙජිනෝල්ඩ් කුරේ

සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය **2019.02.28**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

2018 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශණය

	සටහන්	2018 රු	2017 රු
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**3**	280,501,828.00	304,261,744
කල්බදු ඉඩම් (භාවිතයට අයිති)	**4**	18,906.70	21,270
අස්පෘශ්‍ය වත්කම්	**5**	29,450.32	58,900
අනිකුත් වත්කම්	**7**	371,939,330.58	371,939,331
විකිණිය හැකි මුල්‍ය වත්කම්	**8**	1,200,010.00	1,200,010
ප්‍රාග්ධනිත කෙරීගෙන යන වැඩ		131,244,307.34	69,354,116
අනෙකුත් මුල්‍ය වත්කම්	**14**	20,000,000.00	20,000,000
		------------------	-------------------
ජංගම නොවන වත්කම් එකතුව		**804,933,832.94**	**766,835,371**
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	**9**	2,745,858.16	3,237,996
ලැබිය යුතු දෑ	**10**	64,313,591.70	63,200,313
කල්පිරෙන තෙක් රදවා ගත් ආයෝජන(HTM)	**11**	800,188,693.02	567,554,783
තැන්පත් සහ අත්තිකාරම්	**12**	49,321,891.39	40,066,243
සේවක ණය සහ අත්තිකාරම්	**13**	14,103,633.46	13,925,895
අනිකුත් මුල්‍ය වත්කම්	**14**	688,104,581.39	623,293,480
මුදල් සහ මුදල් සමානයන්	**15**	57,275,773.39	74,351,012
		-------------------	--------------------
ජංගම වත්කම් එකතුව		1,676,054,022.51	1,385,629,722
		----------------------	--------------------
		-	--
මුළු වත්කම්		**2,480,987,855.45**	**2,152,465,093**
ස්කන්ධ සහ බැරකම්			
ස්කන්ධ			
භාණ්ඩාගාරෙය් ප්‍රාග්ධනය දායකය	**16**	30,000,000.00	30,000,000.00
මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල	**17**	30,494,824.09	29,539,654.09
ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල	**18**	72,131,745.17	65,740,500.17
මැණික් ත්‍යාග අරමුදල	**19**	40,070,186.90	36,804,742.29
මැණික් ප්‍රත්‍යාගණන සංචිත	**20**	355,074,648.00	355,074,648.00
ප්‍රත්‍යාගණන සංචිතය	**21**	52,945,424.11	52,945,424.11
රදවා ගත් ඉපයුම්		840,030,910.54	719,269,669.85
ස්කන්ධඑකතුව		**1,420,747,738.81**	**1,289,374,639**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැදියාව	**22**	28,342,050.55	32,437,374
විලම්භිත බදු බැදියාව	**6**	37,217,224.88	36,917,622
-කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද ඉක්මවන	**23.1**	5,433.00	6,499
		---------------	--------------------
ජංගම් නොවන බැරකම් එකතුව		**65,564,708.43**	**69,361,495**
		==========	==========
ජංගම බැරකම්			
කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද නොඉක්මවන	**23.1**	1,737.00	1,920

ගෙවිය යුතු දෑ	**24**	77,468,464.63	74,481,723
මැණික් ගැරීමේ තැන්පතු		513,832,207.64	401,228,523
ආපසු ගෙවිය යුතු තැන්පත් සහ අත්තිකාරම්	**25**	135,836,174.41	102,958,925
ව්‍යවස්ථාපිත ගෙවීම්	**26**	186,952,342.11	153,772,091
වෙන්කිරීම් සහ උපචිත වියදම්	**27**	80,584,482.42	61,285,779
		-------------------	-------------------
ජංගම බැරකම් එකතුව		**994,675,408.21**	**793,728,960**
		-------------------	-------------------
ස්කන්ධ සහ බැරකම් එකතුව		**2,480,987,855.45**	**2,152,465,093**
		============	==========

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඇති බවට මූල්‍ය අධ්‍යක්ෂ සහතික කරයි.

මූල්‍ය අධ්‍යක්ෂක

මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස ගිණුම් ප්‍රතිපත්ති පිටු අංක 16 සිට 27 දක්වා සහ සටහන් පිටු අංක 29 සිට 44 දක්වා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබද වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 21 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

....

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශණය

	සටහන්	2018 රු. ශත	2017 රු. ශත
අයභාරය	**28**	404,203,247.77	452,637,454
අනිකුත් ආදායම්	**29**	56,129,695.04	82,710,991
පරිපාලන වියදම්	**30**	(179,127,130.94)	(197,869,437)
සේවක වියදම්	**31**	(230,150,117.54)	(237,609,903)
ප්‍රවර්ධන වියදම්	**32**	(32,773,946.18)	(101,492,917)
මෙහෙයුම් ලාභය		**18,281,748.15**	**(1,623,810)**
ශුද්ධ මූල්‍ය ආදායම	**33**	**128,275,972.13**	**130,471,162**
ශුද්ධ මූල්‍ය ආදායමට පසු ලාභය		**146,557,720.28**	**128,847,352**
බදුවලට පෙර ලාභය		**146,557,720.28**	**128,847,352**
ආදායම් බදු වියදම්	**34**	(54,763,331.11)	(15,509,347)
වර්ෂය සඳහා ලාභය		**91,794,389.17**	**113,338,005**
වර්ෂය සඳහා ලාභය		**91,794,389.17**	**113,338,005**
අනිකුත් විස්තීරණ ආදායම්			-
ඒකාබද්ධ අරමුදලට දායකය		**(25,000,000.00)**	**(100,000,000.00)**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**66,794,389.17**	**13,338,005**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

අංක 25, ගාලු මුවදොර, කොළඹ 03.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2018	2017
	රු. ශත	රු. ශත
බදු වලට පෙර ලාභය	146,557,720	128,847,352
ගැලපීම්		
ක්ෂයවීම්	32,257,404	32,717,906
අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක් ක්ෂය	29,450	29,450
විශ්‍රාම පාරිතෝෂික බැදීම් සඳහා **වෙ**න්කිරීම්	1,722,598	7,841,363
සේවක වන්දි සඳහා වෙන්කිරීම	(1,700,000)	4,185,974
ලාභාංශ	(1,991,087)	(1,294,650)
ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් වූ ලාභ	(78,100)	(42,569)
පොලී ආදායම්	(128,314,211)	(130,509,189)
කල්බදු ගෙවීම් බැදීම් වලදී ඇතිවූ මුල්‍ය පිරිවැය	38,239	38,027
භාවිතයට අයිති ඉඩම් වල ක්‍රමක්ෂය	2,364	2,364
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	48,524,377	41,789,028
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්		
තොග	492,138	1,604,113
ලැබිය යුත දෑ	(1,113,279)	(17,051,006)
තැන්පතු සහ අත්තිකාරම්	(9,255,648)	2,123,472
සේවක ණය සහ අත්තිකාරම්	(177,738)	(695,419)
ගෙවිය යුතු දෑ	2,986,742	(28,879,864)
මැණික් ගැරීමේ තැන්පතු	112,603,685	5,464,246
තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්	32,877,249	(5,824,922)
වෙන් කිරීම් සහ උපචිත වියදම්	19,298,703	17,898,589
මෙහෙයුම් වලින් ජනිතමුදල්	**206,236,229**	**16,428,237**
පාරිතෝෂික ගෙවීම්	(5,719,079)	(8,423,008)
ගෙවූ බදු	(2,158,637)	(3,385,319)
මෙහෙයුම් වලින් ජනිත ශුද්ධ මුදල්	**198,358,513**	**4,619,910**

ආයෝජන ක්‍රියාකාරකම් තුලින් වු මුදල් ප්‍රවාහය		
යන්ත්‍ර පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම	(60,765,413)	(40,393,339)
ස්ථාවර වත්කම් ඉවත් කිරීමේදි ලැබීම්	78,100	42,569
ලාභාංශ ලැබීම්	1,991,087	1,294,650
අනිකුත් මුල්‍ය වත්කම් වල ශුද්ධ ආයෝජනයන්	(230,073,910)	(58,385,157)
භාණ්ඩාගාර බිල්පත් වල ශුද්ධ ආයෝජන	(65,563,360)	(14,110,197)
පොලී ලැබීම්	128,314,211	130,509,189
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත (භාවිතා කරන ලදා) ශුද්ධ මුදල්	**(226,019,286)**	**18,957,715**
මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහ		
මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල් උපයෝජනය	955,170	855,511
කල්බදු සදහා වු වගකීම් සමථය	(26,325)	(26,325)
ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලට දායකය	6,391,245	9,665,238
මැණික් ත්‍යාග අරමුදලට දායකය	3,265,445	8,852,499
මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහ	**10,585,535**	**19,346,923**
මුදල් සහ මුදල් සමානයන් ශුද්ධ වෙනස්වීම	**(17,075,239)**	**42,924,548**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමානයන්	**74,351,012**	**31,426,464**
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමානයන් (සටහන15)	**57,275,773**	**74,351,012**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

---

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

1.1 පිළියෙල කිරීමේ පදනම

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි ("අධිකාරිය") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය වත්කම් ඒවායේ ඓතිහාසික පිරිවැය, ඒවායේ විකුණුම් මත ලබා ගත හැකි සත්‍ය වටිනාකමට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශන පිලියෙල කර ඇත. සමහර ගැටළු සහගත ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්වල (SLFRSs) නියම කර ඇති කරුණු වලට එකගව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරේ. ගිණුම්කරණ ප්‍රමිත අදාල කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමණාකාරීත්වයේ අවශ්‍යතාවය මත තීරණයකර යොදාගැනේ. සංකීර්ණත්වයෙන් විවිධ වූ තීක්ෂණ ලෙස තීරණ ගැනීමේ කරුණු වලදී හෝ මූල්‍ය ප්‍රකාශන වලට වැදගත් වන කරුණු භාරගැනීම හෝ ඇස්තමේන්තු කිරීම ගිණුම් වල හෙළිදරව් කර ඇත.

1.2 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්

අනිකුත් විදියකින් දක්වා නොමැති නම් පහත සදහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට පරිවර්තනය කිරීම ආරම්භක දිනයට පැවති මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කරන ලද කාල පරිච්ඡේද වලට අදාලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන වල ස්ථිරව යොදාගෙන ඇත.

මෙම වර්ෂයේදී මනාලෙස ඉදිරිපත් කිරීම සහ සැසදීමට හැකිවන පරිදී අවශ්‍ය අවස්ථා වලදී පසුගිය වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

1.3 විදේශීය මුදල් පරිවර්තනය කිරීම

1.3.1 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය සහ ක්‍රියාකාරීත්වය

මූල්‍ය ප්‍රකාශයන්හී අඩංගු ගණු දෙණු සහ ශේෂයන් ආයතනය ක්‍රියාත්මක වනු ලබන මූලික ආර්ථික පරිසරයේදී භාවිතා කරනු ලබන මුදල් මත ගණනය කර ඇත. අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කර ඇත.

1.3.2 **ගණු දෙණු සහ ශේෂයන්**

විදේශීය මුදල් ගණුදෙණු එකී ගණුදෙණුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයන් භාවිතා කරමින් ක්‍රියාකාරීත්වයේ පවතින මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ. එකී ගණුදෙණු පියවීමේදී ඇතිවන විදේශ මුදල් හුවමාරු ලාභය හෝ අලාභය සහ වර්ෂය අවසානයේ පරිවර්තනයන් එදිනට පවතින විදේශ මුදල් හුවමාරු වටිනාකම මත මූල්‍ය වත්කම් සහවිදේශ මුදල් මත ඇතිවන බැදීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හී හදුනාගැනේ.

ක්‍රමක්ෂය පිරිවැය වෙනස් වීම් වලට අදාල මුදල් පරිවර්තිත වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශන වලදී හදුනාගැනේ.

1.3.3 **දේපල, පිරියත හා උපකරණ**

කළමනාකාරීත්වය අදහස් කරන පරිදී වත්කම් යම් ස්ථානයක පිහිටුවීමට හෝ ක්‍රියාකාරීත්වයට ගෙන ඒමට දරනු ලබන ඍජුවම ආරෝපිත කල හැකි ඕනෑම පිරිවැයක් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකමට ඇතුලත්ව හදුනාගැනේ.

1998 වර්ෂයට පෙර අත්පත්කර ගත් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන වටිනාකමට පිළියෙල කර ඇත. ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනයේදී පැවති සාධාරණ වටිනාකම ලෙස අධිකාරිය විසින් භාරගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ තීරණය කරන ලද පිරිවැයෙන් සමුච්චිත ක්ෂවීම් අඩුකිරීමෙන් පසුව හාණි පාඩු ලෙස සටහන් කරනු ලැබේ. 1998 වර්ෂයෙන් පසුව අත්පත් කර ගන්නා ලද දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂවීම් අඩු කිරීමෙන් පසුව හාණි පාඩු ලෙස ගණනය කරනු ලැබේ.

වත්කමක් මිලදී ගැනීමෙන් පසුව දරනු ලබන පිරිවැය එම අයිතමය මගින් අධිකාරියට ගෙනදෙන අනාගත ආර්ථික වාසි සමග ඒකාබද්ධව විශ්වාසයකින් ගණනය කල හැකි නම් එයද වත්කමෙහි වටිනාකම ලෙස හදුනාගනු ලබන අතර, අනිකුත් සියළුම අලුත් වැඩියා සහ නඩත්තු සදහා දරනු ලබන ගාස්තු එකී වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශන වල දක්වනු ලැබේ.

ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර අනෙකුත් වත්කම් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ලබන අතර පහත සදහන් අයුරු වත්කමෙහි ඇස්තමේන්තුගත ජීව ආයුකාලය මත එහි ක්ෂයවීම් බෙදාහරිනු ලැබේ.

අයිතම වර්ගය	**ආයු කාලය**	**ක්ෂය**
අනුපාතය		
ගොඩනැගිලි	වසර 30 – 50	2% - 3.33%
බෙදා වෙන්කිරීම්	වසර 3	33.33%
පර්යේෂණාගාර හා ස්වර්ණාභරණ පරීක්ෂණ උපකරණ	වසර 10	10%
ලී බඩු සහ කාර්යාල උපකරණ	වසර 10	10%
රථ වාහන	වසර 4	25%
පරිගණක උපකරණ	වසර 5	20%
අනිකුත් වත්කම්	වසර 10	10%

වත්කමෙහි ඇස්තමේන්තුගත වටිනාකමට වඩා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම වැඩිවන්නේ නම්, වත්කමෙහි ඉදිරියට ගෙන එන වටිනාකම පියවාගත හැකි වටිනාකමට ලියා හරිනු ලැබේ.

1.3.4. අස්පෘශ්‍ය වත්කම්

පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති අත්පත්කර ගැනීමට හා ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන පදනම මත පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති ප්‍රාග්ධනිත කරනු ලැබ්. මිලදී ගත් අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදී ගැනීමට දරන ලද වියදමෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හාණි වූ වටිනාකම අඩුකිරීමෙන් පසු දක්වනු ලැබේ. මෙම පිරිවැය පහත සඳහන් අයුරු ඇස්තමේන්තු ගත ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ**.**

පරිගණක පද්ධති	වසර 5	20%

පරිගණක පද්ධති නඩත්තු සඳහා දරනු ලබන පිරිවැය වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

1.3.5. කල් බදු ඉඩම්

කල් බදු යටතේ දරනු ලබන ඉඩම් පලමුවෙන්ම බදු ගෙවීම් වටිනාකම වර්ධනය වන ණය අනුපාතයන් යටතේ වට්ටම්කර එයට ආරම්භක මූලික පිරිවැය හා ඉන් පසුව දරන්නට සිදුවන පිරිවැය එකතුකර වර්තමාන වටිනාකම සමාන වන පරිදි ගණනය කරනු ලබන අතර කල්බදු ඉඩම් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. කල්බදු ඉඩම් වල වටිනාකම කල් බදු කාලසීමාව තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

කල් බදු ඉඩම්	වසර 30	3.33%

1.3.6. මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීම

සෑම වාර්තාකරනු ලබන කාල පරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල අගය පිළිබද විමසා බැලෙන අතර, එම වත්කම්වල අගය අඩු වීමක් පෙන්නුම් කෙරේද යන්න තීරණය ලැබේ. එවැනි ලක්ෂණයක් පෙන්නුම් කෙරේ

නම්, එම වත්කම් මගින් ආවරණය කරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කර අගය අඩුවීම තීරණය කෙරේ.

විකුණුම් පිරිවැය වත්කමේ සාධාරණ අගයෙන් අඩු කිරීමෙන් පසු ආවරණය වන වටිනාකම වැඩි නම් අගය භාවිතයට ගැනේ. භාවිතා කිරීමේ ඇස්තමේන්තු අගය, අනාගත අස්තමේන්තු මුදල් ප්‍රවාහ වර්තමාන මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකම අනාගත බදු වට්ටම් අනුපාතයෙන් ගණනය කරන අතර එම මුදල් වල වර්තමාන තක්සේරු අගය හා විශේෂ අවධානම් තක්සේරු කරනු ලැබුවද එය අනාගත මුදල් ප්‍රවාහයට ගැලපීම් නොකෙරේ.

වත්කමෙහි දරනු ලබන වටිනාකම ආවරනය කරගත හැකි ඇස්තමේන්තු වටිනාකමට අඩුනම්, දරනු ලබන වටිනාකම ආවරණය කරගත හැකි වටිනාකම දක්වා වත්කමෙහි වටිනාකම අඩු කරනු ලැබේ. අගය අඩුවීමේ පාඩුව විස්තීර්ණ මුදල් ප්‍රකාශයන්හීදී හදුනාගනු ලැබේ.

1.4. **මුල්‍ය වත්කම්**

1.4.1. වර්ගීකරණය

අධිකාරියෙහි මුල්‍ය වත්කම් හදුනාගැනීම අනුව පහත සඳහන් අයුරු වර්ගීකරණය කරනු ලැබේ

i. ණය හා ලැබිය යුතු දෑ
ii. විකුණාගත හැකි දෑ (AFS)
iii. කල්පිරීම දක්වා රදවා ගන්නා වු ආයෝජන(HTM)

i. ණය හා ලැබිය යුතු දෑ

ක්‍රියාකාරි වෙළද පොලෙහි මිල නියම නොකරන ලද, ස්ථිර හෝ තීරණය නොකරන ලද මුලය වත්කම් වලින් පැවත එන දෑ ණය හා ලැබිය යුතු දෑ වේ. වාර්තා කරනු ලබන කාල පරිච්චේදය ඉක්මවා මාස 12 ට වැඩි කාලයකින් කල් ඉකුත් වන දෑ හැර අනිකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් වල ඇතුලත්ව ඇත. වාර්තා කරනු ලබන කාල පරිච්ජේදය අවසානයේ අධිකාරියෙහි පැවති වෙළද හා අනිකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය සුරැකුම් පත් නැවත මිලදී ගැනීම්, තැන්පත්, සේවක ණය හා මුදල් සහ මුදල් සමානදෑ වලින් ණය හා ලැබිය යුතු දෑසමන්විතවේ.

ii. විකුණාගත හැකි දෑ (AFS)

මෙකී වර්ගයට නියම කරන ලද හෝ වෙනත් කිසිදු වර්ගයකට වර්ගීකරණය නොකරන ලද නමුත් පැවත එන මුල්ය වත්කම් විකිණිය හැකි ආයෝජන යටතට

ගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයෙන් පසු මාස 12ක් තුල විකිණීමට තීරණය නොකරන ලද හෝ කල් පිරෙනු ලබන ජංගම වත්කම් ගණයට නොවැටෙන දේ මෙයට ඇතුලත්වේ.විකිණිය හැකි මුල්‍ය වත්කම් දිගුකාලීන ලැයිස්තගත නොවූ ස්කන්ධ ආයෝජනවලින් සමන්විතවේ.

iii. කල්පිරීම දක්වා රදවා ගන්නා වූ ආයෝජන(HTM)

තීරණය කරනු ලබන හෝ ස්ථිර ගෙවීමක් ලබන සහ ස්ථිරව කල් පිරෙනු ලබන ණයහා ලැබිය යුතු දෑ කල්පිරීම දක්වා රදවා ගන්නා වූ ආයෝජනලෙස තීරණය කරනු ලැබේ.අධිකාරිය විසින් දැනට කල් පිරෙන තෙක් රදවාගනු ලබන, යහපත් දැක්මක් ඇති නම් එම ආයෝජනයන් කල්පිරීම තෙක් රදවා ගන්නා ආයෝජන ලෙස වර්ගීකරනය කරනු ලැබේ.

මෙම ආයෝජනයන් වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසන් වීමෙන් පසු මාස 12ක කාලයක් ඉක්මවී කල් පිරෙනු ලබන ඒවා ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කෙරේ. අධිකාරිය දැනට භාණ්ඩාගාර බිල්පත් වල කර ඇති ආයෝජන මේ යටතට ගැනේ.

1.4.2 හදුනා ගැනීම් සහ මුලික ගණනය කිරීම්

ණය හා ලැබිය යුතුදෑ පිළිබද ගණුදෙණුවක් ආරම්භවන දිනයේදී අධිකාරිය විසින්එයමුල්‍ය වත්කම් ලෙස හදුනාගැනේ. අධිකාරිය මුල්‍ය උපයෝජනය සදහා ගිවිසුම් වලට එලඹී එහි එක් පාර්ශවකරුවෙකු වන දිනයේදී අනිකුත් මුල්‍යවත්කම් හදුනාගැනේ.

මුල්‍ය වත්කමක් එහි සාධාරණ අගයට පෙන්නුම් නොකෙරේ නම්, ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගය කෙලින්ම හුවමාරු කිරීමේ පිරිවැය ස්වභාවයද සැලකිල්ලට ගෙනමුල්‍ය වත්කම් මුලිකව ගණනය කරනු ලැබේ.

මුල්‍ය වත්කම් කල් පිරීම හෝ හුවමාරු කිරීම සිදුවන අවස්ථාවේදී මුදල් ප්‍රවාහයන් ලැබීම හෝ හිමිකම් ඇතිවන අවස්ථාවේදී නැවත හදුනා ගැනෙන අතර පසුවඅධිකාරිය මුල්‍ය වත්කම්වල අයිතිය මතසියළුඅවධානම් සහ යහපත් ප්‍රතිඵලයන් මාරු කරනු ලැබේ.

1.4.3 දෙවනුව ගණනය කිරීම්

i. ණය සහ ලැබිය යුතු දෑ

මුලික හදුනාගැනීමෙන් පසුව ණය හා ලැබිය යුතු දෑ බල පැවැත්වෙන පොලී අනුපාතයන් මත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය භාවිතාකර හාණි හා පාඩු සදහා වෙන් කිරීම් අඩුකර දෙවනුව ගණනය කෙරේ.

ii. **විකුණාගත හැකි දෑ (AFS)**

මුලික හදුනාගැනීමෙන් පසුව ලැයිස්තු ගත නොවූ ආයෝජන විකුණාගතහැකි මූල්‍ය වත්කම් ලෙස වර්ග කෙරෙන අතර එහි වර්තමාන වටිනාකම නියත වශයෙන් ඇස්තමේන්තු කල නොහැකි විට පිරිවැයෙන් වෙළඳ පල අගය නිසා ඇතිවන අලාභය අඩු කිරීමෙන්ද පසු ගණනය කරනු ලැබේ.

iii. **කල්පිරීම දක්වා රදවා ගන්නා වු ආයෝජන(HTM)**

කල් පිරෙන තෙක් රදවා ගන්නා ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය, බල පැවැත්වෙන පොලී අනුපාතයන් භාවිතා කරමින් වු ගණනය කිරීම් හාණි සහ පාඩු අඩු කිරීමෙන් පසුව ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී හා හුවමාරු පිරිවැය මත වට්ටම් සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

1.4.4 මුල්‍ය වත්කම් මත හාණි හා පාඩු

I. **වත්කම් ක්‍රමක්ෂය පිරිවැය මත දැක්වීම**

මූල්‍ය වත්කම් වල වටිනාකම හාණි වී තිබෙන බවට පිලිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ජේදයක් අවසානයේදීම අධිකාරිය විසින් තක්සේරු කරනු ලැබේ. මුල්‍ය වත්කමක අගය අඩුවී තිබේනම් එම හාණි වීමෙන් සිදුවු අඩුවීම අඩංගුව ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේ නම්ද, වත්කමක් හදුනාගැනීමෙන් පසු සිද්ධීන් එකක් හෝ කිහිපයක ප්‍රථිඵලයක් ලෙස එය ඇතිවී ඇත්නම් සහ එකී පාඩු අවස්ථාව හෝ අවස්ථාවන් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රමාණයන්ට බලපෑමක් සිදු කෙරෙන විට එය පිළිගත හැකි ලෙස ඇස්තමේන්තු කෙරේ.

ණය හා ලැබිය යුතු දෑ කල් පිරෙන තෙක් රදවා ගන්නා ආයෝජනයන් ඒවායේ හිලව් වන පිරිවැයට ගනු ලබන අතර වත්කම දරනු ලබන වටිනාකම සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම (ඇතුලත් නොවූ අනාගත බැර පාඩු හැර) අනුව අලාභය ගණනය කර එම මුල්‍ය වත්කම බල පවත්වන සත්‍ය පොලී අනුපාතය මත වට්ටම් කරනු ලැබේ.මුල්‍ය වත්කම්වල දරනු ලබන අගයෙන් හදුනාගනු ලබන පාඩු අඩුකර එය විස්තීරණ ආදායම් ප්‍රකාශයන්ට ගණු ලැබේ.

පසු කාල පරිච්ජේදයේදී හාණි පාඩු වටිනාකම අඩු වන්නේ නම්ද හාණි පාඩු සිදුවීමෙන් පසු අඩුවීම කෙලින්ම බලපානු ලබන්නේ නම්ද, එය හදුනාගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන් මගින් පෙර හදුනාගත් හාණි පාඩු වටිනාකම යථා තත්ත්වයට ගෙන එනු ලැබේ.

II **විකුණාගත හැකි දෑ (AFS)**

මූල්‍ය වත්කමට හාණි පාඩු සිදුවී ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය එය තක්සේරු කරනු ලැබේ. ලැයිස්තුගත නොකල ආයෝජනයන් සඳහා, ආයෝජනයන්ගේ වටිනාකම සැලකිය යුතු හෝ දිගින් දිගටම පිරිහීම පිළිබද සාක්ෂි ඇත්නම් වත්කමේ අගය අඩු කරනු ලැබේ. මිල නියම නොකල ආයෝජනයන් සදහා එවැනි සාක්ෂි තිබේනම්, මූල්‍ය වත්කම දරනු ලබන වටිනාකම සහ වෙනත් එවැනි වත්කමක් සඳහා වර්තමාන ඉපයීම් වෙළඳපල අනුපාතය මගින් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් වට්ටම්කිරීමෙන් ලැබෙන වර්තමාන අගය අතර වෙනසගණනය කර හාණි පාඩු සිදුවූ වටිනාකම ගණනය කරනු ලැබේ.එවැනි හාණි පාඩු යථා තත්ත්වයට පත් කරනු නොලැබේ.

1.5 භාණ්ඩ තොග

පලමු ලැබීම් පලමු නිකුත් කිරීම් (FIFO)පදනම මත පිරිවැය තීරණය කර ශුද්ධ උපලබ්ධි අගය හෝ ගත්මිල යන දෙකෙන් අඩු අගය මත තොගයන් දක්වා ඇත. පාරිභෝගික භාණ්ඩ සහ ලිපිද්‍රව්‍ය වලින් තොග සමන්විතවේ.

1.6 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ මුලින්ම එහි සත්‍ය වටිනාකම් මත (ඉන්වොයිස් අගය) හදුනා ගැනීමද, ඉන් පසුව මුල් ඉන්වොයිස් වටිනාකම කෙටි කාලයක් තුල ආපසු ලැබේයයි බලාපොරොත්තුවෙන් වෙළද පල වටිනාකම සලකා එයින් හාණි සදහා අඩු කිරීමද සිදු කරන අතර, මුදල් වල කාලීන වටිනාකම සැලකිල්ලට නොගැනේ.

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ආපසු ලැබිය යුතු දෑ වල වෙළද පල වටිනාකම වෙනස්වීම් වලට අදාල සාක්ෂි තිබේදැයි අධිකාරිය විසින් තීක්ෂණව තක්සේරු කරනු ලැබේ. අධිකාරියෙහි පසු ගිය අත්දැකීම් අනුව මුදල් එකතු කිරීමේ සහ ලැබීම් ප්‍රමාද සංඛ්‍යාව, ලැබීම්වල අගය අඩුවීමක් තිබේනම් එම හාණි පාඩු ඇතුලත් වන බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් ලැබිය යුතු දෑ හාණි පාඩු සඳහා වෙන වෙනම තක්සේරු කරනු ලැබේ.

1.7 මුදල් හා මුදල් සමානදෑ

මුදල් හා මුදල් සමානදෑ තුල අතැති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු, මාස තුනක් හෝ ඊට පෙර කල් පිරෙනු ලබන ආයෝජන සමග අතිකුත් ඉතා ඉහල ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන මූලික කල්පිරීමේ වටිනාකම් මත මුදල් ප්‍රවාහ තුල ඇතුලත් කර ඇත.

1.8 දායකත්ව ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

1.9 මූල්‍ය බැරකම්

අධිකාරියෙහි මූල්‍ය බැරකම් අනිකුත් මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. අධිකාරියෙහි අනිකුත් මූල්‍ය බැරකම් වලට ගෙවිය යුතු දෑ, බලපත්‍ර සඳහා ලැබූ අත්තිකාරම්, මැණික් ගැරීමේ තැන්පතු හා අනිකුත් තැන්පත් ලැබීම් ඇතුලත්වේ. මූල්‍ය වත්කම් මුහුණත වටිනාකමට කෙලින්ම හුවමාරු පිරිවැයක් වෙත්නම් එයද ඇතුලත්ව මුලින්ම හදුනා ගැනේ. මූලික හදුනාගැනීමෙන් පසුව කෙටි කාලයක් තුලදී ආපසු ගෙවීමට බලාපොරොත්තුවන හිග මුදල්වල මූලික වටිනාකම අනුව ගණනය කර හදුනා ගැනීම සිදුකෙරේ.

කල් පිරීම, අවලංගු කිරීම, ගිවිසුම් ගත බැඳීම් වලින් නිදහස් වීම වැනි අවස්ථා වලදී අධිකාරිය නැවත මූල්‍ය බැරකම් හදුනා ගැනේ.

1.10 ප්‍රවර්තන හා විලම්භීත බදු

කාල පරිච්ඡේදය තුල දරන ලද බදු වියදම් වල වර්තමාන හා විලම්භීත බදු අඩංගුවේ. අනිකුත් විස්තීරණ ආදායම් අයිතමයන් ප්‍රමාණයන් හැර විස්තීරණ ආදායම් ප්‍රකාශයන් මගින් ආදායම් බදු හදුනා ගැනේ. මෙම කරුණෙහිදී පවා විස්තීරණ ආදායම් ගිණුම මගින් බදු හඳුනාගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසානයේදී පවත්නා බදු නීතියට අනුව අධිකාරියෙහි ක්‍රියාකාරීත්වය මගින් උත්පාදනය වන බදු අයවන ආදයම් පදනම මත වර්තමාන බදු ගණනය සිදු කෙරේ. කළමණාකාරීත්වය විසින් සුදුසුතම බදු පදනම යටතේ බදු අධිකාරීන් වෙත ගෙවිය යුතු යැයි බලාපොරොත්තුවන බදු සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් හා වගකීම් ඒවායේ දරනු ලබන වටිනාකම මත පැන නගින තාවකාලික වෙනස අනුව විලම්භීත බදු වගකීම හදුනාගැනේ. බදු සඳහා ගනන් ගැනෙන ලාභ හෝ පාඩු මගින් ගිණුම් වලට බල පෑමක් සිදු නොවන ගණුදෙණු සිදුවන අවස්ථා වලදී හැර වත්කම් හා වගකීම් සම්බන්ධ ගණුදෙණු සිදුවන අවස්ථාවලදී විලම්භීත බදු ගිණුම් ගත නොකෙරේ. කාල පරිච්ඡේදය අවසන් වන දිනයට බල පවත්වන බදු අනුපාතයන් භාවිතයෙන් වත්කම් හා වගකීම් වල ඉදිරියට ගෙන යන නිරවුල් කලයුතු ශේෂය හා අපේක්ෂිත උපලබ්ධි මුදල මත පදනම්ව විලම්භීත බදු මුදල ගණනය කෙරේ.

අනාගත බදු වත්කම් හා වගකීම් වර්තන බදුවලට එරෙහිව හිලව් කිරීම සඳහා නීතිමය බලාත්මක අයිතියක් තිබේනම්, බදු අධිකාරීන් විසින් ආදායම් බදු පැනවීමේදී ඒ හා සම්බන්ධ වේනම් විලම්භිත බදු වගකීම් වර්තන බදු වගකීම් වලට එරෙහිව ලියා හැරේ.

1.11 සේවක ප්‍රතිලාභ

(අ) නිශ්චිත දායකත්ව සැලසුම්

සේවය අවසන් කිරීමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ වෙනුවෙන් අධිකාරිය විසින් ස්ථිර දායකත්ව මුදලක් වෙනත් ආයතනයක තැන්පත් කිරීම නිශ්චිත දායකත්ව සැලසුමට අයත්වේ. අධිකාරිය තවදුරටත් දායකත්ව ගෙවීම සඳහා නීතිමය හෝ වෙනත් සම්බන්ධිත බැඳීම් කිසිවක් නොමැත. සේවක ප්‍රතිලාභ වියදම් ගෙවිය යුතු අවස්ථාවේදී එම දායකයන් හඳුනාගැනේ.

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයන්ගේ දළ සේවා පාරිශ්‍රමිකයන් මත 15% දායක මුදලක්ද, සේවා නියුක්තියන්ගේ භාර අර මුදල සඳහා දළ සේවා පාරිශ්‍රමිකයන් මත 3% ක දායක මුදලක්ද අධිකාරිය විසින් දරනු ලැබේ.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී නිශ්චිත ප්‍රතිලාභ වල එදිනට පවතින වටිනාකම මත අධිකාරියෙහි නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සම්බන්ධව ඇති බැදීයාව ගණනය කෙරේ. යෝජිත ඒකක වගකීම් ක්‍රමය අනුගමනය කරමින් ගණනය කිරීම් පාරිතෝෂික සූත්‍රය භාවිතා කරමින් සිදුකර නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදියාව ගණනය කරනු ලැබේ. සේවකයන්ගේ වර්තමාන හා පසුගිය සේවා කාලය සහ උපයාගත් වැටුප අනාගත ඇස්තමේන්තු ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම ගණනය මත නිශ්චිත ප්‍රතිලාභ බැදීම් තීරණය කරනු ලැබේ.

ගණනය කිරීම් වල වෙනස්වීම් මත පැන නගිනු ලබන ලාභය හෝ පාඩුව ඒවා පැන නගිනු ලබන කාල පරිච්ඡේදය, වර්තමාන සේවා පිරිවැය හා පොලිය විස්තීරණ ආදායම් ප්‍රකාශ වලට ඇතුලත්වේ.විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් සඳහා පිටතින් අරමුදල් සපයා ගණු නොලැබේ.

(ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

සේවකයා විසින් සපයන ලද සේවය පදනම් කරගෙන ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂා කරනු ලබන වට්ටම් නොකරන ලද මුදල මත කෙටිකාලීන සේවක ප්‍රතිලාභ බැදීම ගණනය කරනු ලැබේ.

1.12 ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

නිශ්චිත වශයෙන් ගණනය කල හැකි හා ආර්ථික සම්පත් ඉවතට ගලායාමේ සම්භාවිතාවක් ඇති බව පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස නීතිමය අයුරින් හෝ වටහා ගතහැකි පරිදී වර්තමාන බැදීම් අධිකාරියට ඇතිවිට නීතිමය ඉල්ලීම් මත ප්‍රතිපාදන හා අනිකුත් ක්‍රියාකාරි වියදම් හදුනාගැනේ.

වාර්තාකරනු ලබන දිනය වන විට පිළිගත හැකි සාක්ෂි තිබේනම් හා වර්තමාන බැදීම් සමග අවධානම සහ අවිනිශ්චිතාව සම්බන්ධ වී ඇතුලත්ව තිබේ නම්, වර්තමාන බැදීම් පියවීම සඳහා අවශ්‍යවන ඇස්තමේන්තුගත වියදම් අනුව ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සම්පත් ඉවතට යාමේ සම්භාවිතාවයක් නොමැති නම් සියළු අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

1.13 අදායම් හදුනා ගැනීම

ලැබිය යුතු හා ලැබු මුදල්වල සාධාරණ අගය සැලකිල්ලට ගෙන ආදායම් ගණනය කරන අතර මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීම, බලපත්‍ර ගාස්තු, නිර්යාත කොමිස් හා සේවා සැපයීම් වෙනුවෙන් ලැබිය යුතු මුදල්, එකතු කල අගය මත බදු (VAT) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT)අඩු කිරීමෙන්පසු දක්වා ඇත. ආදායම් නිශ්චිත ලෙස ගණනය කල හැකි විටදී සහ අධිකාරිය වෙත අනාගතයේදී ආර්ථික පහසුකම් ලගා වේනම් ආදායම් හදුනා ගැනේ.

අධිකාරිය විසින් ප්‍රධාන වර්ගයේ සේවා සැපයීම් වෙනුවෙන් වු ආදායම් හදුනාගැනීම පහත සදහන් පරිදී යොදා ගැනේ.

(අ) මැණික් ගැරීමේ අයිතිය අලෙවිය (ඉඩම් වෙන්දේසි)

මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීමේදී මැණික් ගැරීම සඳහා ඉඩම් කැබලි වෙන්කර බලපත්‍ර ලබාදීම,මිල ගණන් කැදවීමේ ක්‍රමය අනුගමනය කර සිදුකෙරේ. මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදී අදායම් හදුනාගැනේ.

(ආ) බල පත්‍ර ගාස්තු - මැණික් කැපීමේ සහ මැණික් අලෙවි බලපත්‍ර

බල පත්‍රයේ කාල සීමාව අනුව ඍජු ක්‍රමය යටතේ බලපත්‍ර ගාස්තු ආදායම් හදුනාගැනේ.

(ඈ) බල පත්‍ර ගාස්තු - මැණික් ගැරීමේ, යන්ත්‍ර මගින් මැණික් ගැරීමේ (BACO)සහ මැණික් වෙන්දේසි බලපත්‍ර

මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදි බලපත්‍ර ගාස්තු ආදායම් හදුනාගැනේ.

(ඈ) මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත කොමිස් - (නිර්යාත සේවා ගාස්තු සහ කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු)

භාණ්ඩ නිර්යාත කිරීමට සුදානම් කල අවස්ථාවේදී නිර්යාත කොමිස් ආදායම් ලෙස හදුනාගැනේ.

(ඉ) සේවා

මැණික් ඉඩම් පරීක්ෂා කිරීම වෙනුවෙන් වූ ආදායම් ගෙවීම් ලැබෙන අවස්ථාවේදී ආදායම් ලෙස හදුනා ගැනේ.

(ඊ) කුලී ආදායම්

බදු කොන්දේසි සැලකිල්ලට ගෙන උපචිත පදනම මත කුලී ආදායම හදුනා ගැනේ.

(උ) පොළී ආදායම්

ක්‍රියාත්මක වන පොලී ක්‍රමය මත පොළී ආදායම් හදුනාගැනේ.

(ඌ) ලාභාංශ ආදායම්

ගෙවීම් කිරීම තහවුරු කරනු ලබන අවස්ථාවේදී ලාභාංශ ආදායම් හදුනාගැනේ.

(එ) දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු

ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු තීරණය කිරීම එම වත්කමෙහි දරනු ලබන අගය සහ විකුණා ලැබෙන මුදල සමග සැසඳීමෙන් පසුව විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හීදී සිදුකෙරේ.

1.14 වියදම්

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේයට අදාලව ලාභ ඉපයීම සඳහා ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාමට දරනු ලබන සියළු වියදම් ඇතුලත්වේ.

1.15 වාර්තා කරනු ලබන කාලයට පසු සිදුවීම්

වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයට පසු සිදුවීම් වල ප්‍රමාණාත්මක බව සලකා අවශ්‍ය පරිදී ගැලපීම් සිදුකර මුල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

1.16 බැදීම්

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ පවතින සියළු ප්‍රමාණාත්මක බැදීම් හදුනාගෙන මුල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

1.17 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණයන්

මුල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී කළමණාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හදුනා ගැනීමට සහ ඒවා ගණනය කිරීම සඳහා බොහෝ තීරණයන් මත ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදුකර ඇත.

i. මුල්‍ය ප්‍රකාශනවලට බොහෝ බලපෑම් ඇති කරනු ලබන ගිණුම් ප්‍රමිත භාවිතා කිරීමේදී පහත සදහන් වැදගත් තීරණයන් ගනු ලැබීය.

(අ) විලම්භිත බදු වත්කම් හදුනාගැනීම

වත්කම්වල අනාගත ප්‍රයෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ බදු ආදායමක් ලැබීමේ සම්බන්ධතාවයක් පවතීනම් එම වත්කම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හදුනාගැනේ.

ii. වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හදුනාගැනීම සහ ගණනය කිරීම් වලදී බොහෝ වැදගත් සිදුවීම් සදහා ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබද තොරතුරු පහත දක්වා ඇත.

(අ) ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ඇස්තමේන්තු කිරීමේදී එම වත්කමෙහි යෝජිත ආර්ථික භාවිතය පදනම්ව කළමනාකාරිත්වය සලකා බලනු ලැබේ. මෙම ඇස්තමේන්තු වලදි තාක්ෂණිකව අභාවයට යෑම පිළිබද පරිගණක උපාංග හා පරිගණක මෘදුකාංග වල අවිනිශ්චිතතාවයක් පවතී.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

උපකල්පනයන් ගණනාවක් භාවිතා කරමින් හා සාධක ගණනාවක් සැලකිල්ලට ගනිමින් යෝජිත ඒකක බැර පදනම මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදීම් වල වර්තමාන වටිනාකම තීරණය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදීම් සහ ශුද්ධ පිරිවැය උපකල්පනය කිරීමේදී යොදාගන්නා වට්ටම් අනුපාතයන් හෙළිදරව් කර ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැදීම් වල වර්තන වටිනාකමට මෙම උපකල්පනයන්ගේ වෙනස්වීම් බලපානු ලැබේ.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියශ්‍රී ලංකා රුපියල් වලින්

අංක 25, ගාලු මුවදොර, කොළඹ 03.

2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2.

	දායක ප්‍රාග්ධනය	මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල	ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල	මැණික් ත්‍යාග අරමුදල	අනිකුත් සංචිත	මැණික් ප්‍රත්‍යාගණන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	රදවාගත් ඉපයුම්	එකතුව
2017ජනවාරි 01 දිනට ශේෂය	**30,000,000**	**28,684,143**	**56,075,263**	**45,657,241**	**-**	**355,074,648**	**52,945,425**	**699,402,296**	**1,267,839,646**
සාධාරණ අගයට ගැලපීම්	-	-	-	-	-	-	-	-	-
වර්ෂය සඳහා ලාභය								13,338,005	13,338,005
අනිකුත් විස්තීරණ ආදායම්	-	-	-	-	-	-	-	-	**-**
විස්තීරණ ආදායම් එකතුව	-	-	-	-	-	-	-	-	1,281,177,651
පසුගිය වර්ෂයට ගැලපීම්								6,528,739	6,528,739
වර්ෂය සඳහා දායකත්වය/ (උපයෝජනය)	-	855,511	9,655,237	(8,852,499)		-	-	-	1,668,249
අගය අඩුවීමට ගැලපීම්									
2017දෙසැම්බර් 31 දිනට ශේෂය	**30,000,000**	**29,539,654**	**65,740,500**	**36,804,742**	**-**	**355,074,648**	**52,945,425**	**719,269,670**	**1,289,374,639**
සාධාරණ අගයට ගැලපීම්	-	-	-	-	-	-	-	-	-
වර්ෂය සඳහා ලාභය	-	-	-		-	-	-	66,794,389	66,794,389
අනිකුත් විස්තීරණ ආදායම්	-	-	-	-	-	-	-	-	-
විස්තීරණ ආදායම් එකතුව									-
පෙර වර්ෂය සඳහා ගැලපීම්								53,966,852	53,966,852
වර්ෂය තුල දායකත්වය/ (උපයෝජනය)	-	-	-	-	-	-	-	-	-
හාණි පාඩු සඳහා ගැලපීම්	-	955,170	6,391,245	3,265,445	-	-	-	-	10,611,860
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**30,000,000**	**30,494,824**	**72,131,745**	**40,070,187**	**-**	**355,074,648**	**52,945,425**	**840,030,911**	**1,420,747,740**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

අංක 25, ගාලු මුවදොර, කොළඹ 03.

2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

3.

දේපල, පිරියත හා උපකරණ පිරිවැයට	2018 ජනවාරි 01 දිනට	එකතු කිරීම්	ඉවත් කිරීම්	ගැලපීම්	2017දෙසැම්බර් 31 දිනට
බැදීම් වලින් නිදහස්					
ඉඩම්	40,374,059		-	-	40,374,059
ගොඩනැගිලි	162,234,795	493,576	-	(5,460,000)	157,268,371
සවිකිරීම් සහ උපකරණ	18,808,432	1,842,642	-	-	20,651,074
ලීබඩු	14,794,144	477,492	-	-	15,214,412
කාර්යාල උපකරණ	22,293,576	827,750	(57,224)	-	23,121,326
පරිගණක	28,952,907	380,984	-	-	29,333,891
පර්යේෂණාගාර උපකරණ	35,907,233	197,000	-	-	36,104,233
මැණික් කැපීමේ උපකරණ	403,475	-	-	-	403,475
ස්වර්ණාභරණ උපකරණ	148,200	-	-	-	148,200
තත්ත්ව මුද්‍රා උපකරණ	131,884,203	3,897,444	-	-	135,781,647
යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ	9,899,249	53,000	-	-	9,952,249
රථ වාහන	115,782,088	-	-	-	115,782,088
යතුරු පැදි	100,000	-	-	-	100,000
පාපැදි	37,334	-	-	-	37,334
පුස්තකාල පොත්	-	-	-	-	-
ඉඩකඩ වෙන්කිරීම්	9,238,579	-	-	-	9,238,579.00
ඉඩකඩ වෙන්කිරීම් - ජංගම පරීක්ෂණාගාර	2,456,500	-	-	-	2,456,500.00
කල් බදු					
ඉඩම්	159,205	-	-	-	159,205
	593,473,979	**8,169,888**	**(57,224)**	**(5,460,000)**	**596,126,643**

ක්ෂයවීම් බැදීම් වලින් නිදහස්	**2018 දෙසැම්බර් 31 දිනට**	**වර්ෂයට අදාල**	**(ඉවත් කිරීම්)**	**ගැලපීම්**	**2018 දෙසැම්බර් 31 දිනට**
ගොඩනැගිලි	46,858,148	3,135,794	-	(3,834,666)	46,159,276
සවිකිරීම් සහ උපකරණ	13,291,100	871,816	-	-	14,162,916
ලීබඩු	11,148,202	719,798	(57,224)	-	11,810,776
කාර්යාල උපකරණ	13,325,559	1,608,700	-	-	14,934,259
පරිගණක	22,580,062	2,681,438	-	-	25,261,500
පර්යේෂණාගාර උපකරණ	17,417,294	2,548,255	-		19,965,549
මැණික් කැපීමේ උපකරණ	403,475	-	-	-	403,475
ස්වර්ණාභරණ උපකරණ	148,200	-	-	-	148,200
තත්ත්ව මුද්‍රා උපකරණ	38,757,057	12,014,316	-	-	50,771,373

යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ	8,494,732	164,334	-	-	8,659,066
රථ වාහන	104,281,317	6,529,709	-	-	110,811,026
යතුරු පැදි	100,000		-	-	100,000
පාපැදි	37,334		-	-	37,334
පුස්තකාල පොත්	-		-	-	-
ඉඩකඩ වෙන්කිරීම්	6,867,940	1,369,119	-	-	8,237,059
ඉඩකඩ වෙන්කිරීම් - ජංගම පරීක්ෂණාගාර	614,125	614,125	-	-	1,228,250
	284,324,545	**32,257,404**	**(57,224)**	**(3,834,666)**	**312,690,059**

ශුද්ධ ධාරන අගය	2018 දෙසැම්බර් 31 දිනට	2017 දෙසැම්බර් 31 දිනට	2017 ජනවාරි 01
බැදීම් වලින් නිදහස්			
ඉඩම්	40,374,059	40,374,059	39,489,184
ගොඩනැගිලි	111,109,095	115,376,647	117,108,331
සවිකිරීම් සහ උපකරණ	6,488,158	5,517,332	1,112,919
ලීබඩු	3,403,636	3,645,942	3,737,423
කාර්යාල උපකරණ	8,187,067	8,968,019	8,883,156
පරිගණක	4,072,391	6,372,845	8,068,824
පර්යේෂණාගාර උපකරණ	16,138,684	18,489,938	8,975,359
මැණික් කැපීමේ උපකරණ	-	-	27,160
ස්වර්ණාභරණ උපකරණ	-	-	-
තත්ත්ව මුද්‍රා උපකරණ	85,010,274	93,127,146	100,367,685
යන්ත්‍ර සහ ගෙවුඩඋපකරණ	1,293,183	1,404,517	861,732
රථ වාහන	4,971,062	11,500,770	11,818,708
යතුරු පැදි	-	-	-
පාපැදි	-	-	11
පුස්තකාල පොත්	-	-	5,700
ඉඩකඩ වෙන්කිරීම්	1,001,520	2,370,639	884,875
ඉඩකඩ වෙන්කිරීම් - ජංගම පරීක්ෂණාගාර	1,228,250	1,842,375	-
කල්බදු			
ඉඩම්	159,205	159,205.26	159,205
	283,436,584	**309,149,434.26**	**301,500,272**
අගය අඩුවීමට ගැලපීම්	(2,934,756)	(4,887,690.00)	(4,887,690)
	280,501,828	**304,261,744.26**	**296,612,582**

.

විගණක වරුන්ගේ නිර්දේශයන් අනුව සමහර මෝටර් වාහන වාහන අංක PD – 9093 සහ PD- 9084 වාහන හැර අනිකුත් වාහනවල වටිනාකම නැවත තක්සේරු කරන ලදී. සුදුසුකම්ලත් විගණකවරුන් විසින් නැවත තක්සේරු කරන ලද වටිනාකම රු.56,230,000 ක් විය.

බෙලිදෙණිය ඉඩම - හෙක්ටයාර 0.1095 ක් වු මෙම ඉඩම 2017 ජූලි 07 දිනැති විශේෂ ගැසට් පත්‍රය මගින් නැවත ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙත පවරා ගන්නට යෙදුණි.

4 කල්බදු ඉඩම් - ඉඩම් භාවිතය සදහා අයිතිය

කල් බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම ණයට ගැනීම් සදහා වූ වර්ධනය වන වට්ටම් අනුපාතය මත ගණනය කිරීමෙන් පසු වටිනාකමට කල්බදු ඉඩම් ඉඩම් භාවිතය සදහා අයිතිය ගණනය කරනු ලැබේ.

ඉඩම් භාවිතය සදහා	2018	2017
දරනවටිනාකම		
ප්‍රාග්ධනිත අගය		
ජනවාරි 01 දිනට	**70,909.00**	**70,909.00**
ඇතුලත් මුලික පිරිවැය	-	-
වර්ෂයතුල ප්‍රාග්ධනිත කිරීම්	-	-
දෙසැම්බර් 31 දිනට	**70,909.00**	**70,909.00**
ක්‍රමක්ෂය		
ජනවාරි 01 දිනට	**49,638.60**	**47,275**
වර්ෂය තුල ක්‍රමක්ෂය වීම	2,363.70	2,364
දෙසැම්බර් 31 දිනට	**52,002.30**	**49,639**
දරනු ලබන වටිනාකම	**18,906.70**	**21,270**

ඉඩම්වල කල්බදු අයිතිය 1997 නොවැම්බර් මස ආරම්භ වි අවරුදු 30 දක්වා වේ. කල්බදු කොන්දේසි අනුව 2026 නොවැම්බර් දක්වා වාර්ෂිකව ඉඩම් භාවිතය සදහා වූ කල්බදු අයිතිය සංක්‍රාන්ති අවධිය වූ (2011 ජනවාරි 01) සිට ඉදිරි කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

5 අස්පෘශ්‍ය වත්කම්	2018 දෙසැම්බර් 31 දිනට	එකතු කිරීම්/ඉවත් කිරීම්	2017 දෙසැම්බර් 31 දිනට
5.1 පිරිවැයට			
පරිගණක මෘදුකාංග	2,677,306.12	-	2,677,306
එකතුව	2,677,306.12	-	2,677,306
	2018 දෙසැම්බර් 31 දිනට	**වර්ෂය සදහා වැය**	**2017 දෙසැම්බර් 31 දිනට**
5.2 ක්‍රමක්ෂය			
පරිගණක මෘදුකාංග	2,647,855.80	29,450	2,618,406
එකතුව	**2,647,855.80**	**29,450**	2,618,406

	5.3 ශුද්ධ ධාරන අගය		**2018 දෙසැම්බර් 31 දිනට**	**2017දෙසැම්බර් 31 දිනට**
	පරිගණක මෘදුකාංග		**29,450.32**	**58,900**
6	**විලම්භීත බදුවත්කම්/(වගකීම්)**		**2018**	**2017**
	ජනවාරි 01 දිනට ශේෂය		(36,917,622.00)	(28,620,113)
	ගැලපීම්		(299,602.88)	(8,297,509)
	දෙසැම්බර් 31 දිනට ට ශේෂය		**(37,217,224.88)**	**(36,917,622)**
7	**අනිකුත් වත්කම්**		**2018**	**2017**
	රළු ගල් සහ සින්තටික් ගල්		96,682.58	96,682.58
	ප්‍රදර්ශන මැණික් ගල්		371,842,648.00	371,842,648.00
	මැණක් සහ මැණික් ආයතන වලට අත්තිකාරම් ගෙවීම්		200,000.00	200,000.00
			372,139,330.58	372,139,331.58
	හාණි පාඩු සඳහා වෙන්කිරීම්		(200,000.00)	(200,000.00)
			371,939,330.58	**371,939,331**
8	**විකිණිය හැකි (AFS)**			
	මුල්‍යවත්කම් ලැයිස්තු ගත නොකල ආයෝජන	(සටහන් 8.1)	**1,200,010.00**	**1,200,010.00**
	8.1 ලැයිස්තු ගත නොකල ආයෝජන	කොටස් සංඛ්‍යාව		
	සීමා සහිත ලංකා එක්සත් පුවත්පත් සමාගම	20,000	200,000.00	200,000.00
	ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගම	100,000	1,000,000.00	1,000,000.00
	එල්ජීඑල් පුද්ගලික සමාගම	1	10.00	10.00
			1,200,010.00	**1,200,010.00**
9	**භාණ්ඩ තොග**			
	පාරිභෝගික භාණ්ඩ		1,032,275.48	1,594,393.79
	මැණික් - ගෙවුඩ මධ්‍යස්ථානය		183,547.54	183,547.54
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය තොග		1,530,035.14	1,460,054.68
			2,745,858.16	**3,237,996.01**

10	**ලැබිය යුතු දෑ**		
	ලැබිය යුතු දෑ	63,364,424.33	60,224,000.78
	හාණි පාඩු සඳහා වෙන්කිරීම	(1,407,972.00)	(1,407,972.00)
		61,956,452.33	**58,816,028.78**
	අනිකුත්	2,357,139.37	4,384,284.37
		64,313,591.70	**63,200,313.15**
11	**කල් පිරෙන තෙක් වු ආයෝජන (HTM)**		
	ක්‍රමක්ෂය පිරිවැය මත දරන වටිනාකම		
	භාණ්ඩාගාර බිල්පත්	**800,188,693.02**	**567,554,782.56**
12	තැන්පතු සහ අත්තිකාරම්		
	පොදු තැන්පත්	47,681,813.39	39,532,823.87
	අනිකුත්	14,525.00	14,525.00
	ආරක්ෂිත තැන්පතු	59,500.00	161,000.00
	සැපයුම්කරුවන්ට ගෙවු අත්තිකාරම්	3,000,000.00	1,791,841.15
		50,755,838.39	**41,500,190.02**
	හාණි පාඩු සඳහා වෙන්කිරීම්	(1,433,947.00)	(1,433,947.00)
		49,231,891.39	**40,066,243**
13	**සේවක ණය සහ**		
	අත්තිකාරම්		
	අත්තිකාරම්	73,315.01	28,913.87
	වැටුප් රහිත නිවාඩු	185,212.05	216,849.55
	වාහන ණය	4,574.34	84,574.34
	රෙදිපිළි ණය	110,000.24	20,000.24
	ආපදා ණය	12,918,234.72	12,337,770.56
	ගංවතුර ණය	812,297.10	1,237,786.56
		14,103,633.46	13,925,895.12
14	**අනිකුත් මුල්‍ය වත්කම්**		
	ස්ථාවර තැන්පත්	688,945,512.47	625,245,497.96
	රාජ්‍ය ආයතන තාවකාලික	19,159,068.92	18,047,982.05
	අතිරික්ත අරමුදල		
		708,104,581.39	**643,293,480.01**

15 මුදල් සහ මුදල් සමාන දෑ

REPO හීආයෝජන	27,560,000.00	-
මුදල් හා බැංකු ශේෂයන් - ශ්‍රී. ලං. රු	27,839,294.56	73,330,334.38
බැංකු ශේෂය (විදේශ **ව්‍ය**වහාර මුදල්)	1,876,478.83	1,020,677.55
සුළු මුදල්	-	-
	57,275,773.39	**74,351,012.93**

16. **දායක ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

17. **මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල**

මැණික් කර්මාන්තයේ නියුතු සේවකයන්ගේ ජීවිත අවධානම නිසා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අධිකාරිය විසින් 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතේ 1 කොටසේ 14(එන්) වගන්තියට අනුකූලව 2008 වනතුරු මැණික් ගරන්නන්ගෙන් අරමුදල් එකතු කරන ලදී.

18. **ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල**

ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනය වෙනුවෙන් 2007 අයවැය යෝජනා අනුව ස්වර්ණාභරණ නිෂ්පාදකයින් ගෙන් වාර්ෂික ලියාපදිංචි ගාස්තුව වූ රු.5,000 බැගින් වූ මුදලින් මෙම අරමුදල සංයුක්තවේ.

19. **මැණික් ත්‍යාග අරමුදල**

1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතේ iv කොටසේ 52 වගන්තියේ අවශ්‍යතාවය අනුව අධිකාරිය වෙත ලැබෙන අපරාධ වෙනුවෙන් අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු සහ දඩ මුදල් දඩ අරමුදල වෙත බැර කිරීමෙන් මෙම අරමුදල සමන්විතවේ.

අධ්‍යක්ෂ මණ්ඩල ච**ක්‍රලේ**ඛ අංක 824 උපදෙස් අනුව වැටලීම් කණ්ඩායම්වලට සහ සේවකයන්ට ත්‍යාග පිරිනැමීම සඳහා මෙම අරමුදල නඩත්තු කෙරේ.

20. **මැණික් ප්‍රත්‍යාගණන සංචිත**

මැණික් ප්‍රදර්ශන වලට ඉදිරිපත් කරනු ලබන මැණික් ගල් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවන අතිරික්ත වලින් සමන්විතවේ.

21. **ප්‍රත්‍යාගණන සංචිත**

ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම තුලින් ඇතිවන ප්‍රත්‍යාගණන අතිරික්තයන් ගෙන් ප්‍රත්‍යාගණන සංචිතය සමන්විත වන අතර ප්‍රත්‍යාගණනය කරන ලද එකිනෙක වත්කම් ඉවත් කිරීමේදී එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන අතිරික්ත වටිනාකම රදවාගත් ඉපයුම් වලට මාරු කරනු ලැබේ.

22. **විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්**	**2018**	**2017**
ජනවාරි 01 දිනට ශේෂය	32,437,373.55	34,742,935.55
විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හදුනාගැනීම සටහන් 22.1	1 ,722,598.00	7,814,363.00
2018 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම්	(5,817,921.00)	(10,119,925.00)
2018 වර්ෂයේ ගැලපීම්		-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**28,342,050.55**	**32,437,373.55**

22.1**විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හදුනාගැනීම**

පොළී වියදම	3,791,929.00	3,543,779.00
වර්ෂය තුල අයකිරීම්	1,395,142.00	1,733,592.00
උපකල්පනයන්ගේ වෙනස්වීම් තුලින් පැන නගින (ලාභ/ අලාභ)	(3,464,473.00)	2,536,992.00
	1,722,598.00	**7,814,363**

විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීමේදී අධිකාරියේකළමනාකාරීත්වය වඩාත් උචිත විචල්‍යඇස්තමේන්තු පදනම් කරගෙන මෙම උපකල්පනයන් සංවර්ධනය කෙරේ.

භාවිතා කරනු ලබන මූලික උපකල්පනයන් පහත දැක්වේ.

වට්ටම් අනුපාත (%)	12	10
අනාගත වැටුප් වැඩිවීම් සාමාන්‍ය වේතන (%)	1.3	1.3
සේවක පිරිවැටුම් සාධකය (%)	0.4	1.5
විශ්‍රාම යන වයස (අවුරුදු)	60	60

දිගුකාලීන රජයේ බැදුම්කර වෙළද අනුපාත පදනම මත වට්ටම් අනුපාත තීරණය කරනු ලැබේ.

23 **කල්බදු ගෙවීම් සදහා වු වගකීම**	**2018**	**2017**
දළ වගකීම		
ජනවාරි 01 දිනට	454,776.00	494,264.00
වර්ෂය තුල හදුනා ගැනීම්	-	-
වර්ෂය තුල ගෙවීම්	(39,487.00)	(39,488.00)
දෙසැම්බර් 31 දිනට	**415,289.00**	**454,776.00**
මුල්‍ය පිරිවැය		

ජනවාරි 01 දිනට	**446,359.00**	**484,386.00**
වර්ෂය තුල හදුනා ගැනීම්	-	-
වර්ෂයතුලවිස්තීරණආදායමතුල මුල්‍ය පිරිවැය හදුනා ගැනීම	(38,239.00)	(38,027.00)
අනාගත කාලපරිච්ජේදය සදහා මුල්‍ය පිරිවැය ප්‍රතිපාදනය	**408,120.00**	**446,359**
දෙසැම්බර් 31 දිනට ශුද්ධ බැදීම්	**(7,169.00)**	**8,417**

23.1 වගකීම් වර්ගීකරණය

වර්ෂයක් තුල පියවිය යුතු		
දළවගකීම්	40,157.00	40,158.00
අනාගත කාලපරිච්ජේද සදහා මුල්‍ය පිරිවැය ප්‍රතිපාදනය	(38,420.00)	(38,238.29)
	1,737.00	**1,920**
වර්ෂයක් ඉක්මවීමෙන් පසු පියවිය යුතු		
පියවීම වර්ෂ දෙක සහ පහ අතර		
දළවගකීම්	197,438.00	177,694.00
අනාගත කාලපරිච්ජේද සදහා මුල්‍ය පිරිවැය ප්‍රතිපාදනය	(193,892.00)	(173,936.00)
	3,546.00	**3,758.00**
පියවිම වර්ෂ පහ ඉක්මවු		
දළවගකීම්	177,693.00	236,925.00
අනාගත කාලපරිච්ජේද සදහා මුල්‍ය පිරිවැය ප්‍රතිපාදනය	(175,806.00)	(234,184.00)
	1,887	**2,741.00**
වර්ෂයක් ඉක්මවා පියවිය යුතු වගකීම් එකතුව	**5,433.00**	**6,499.00**
දෙසැම්බර් 31 දිනටශුද්ධ වගකීම් එකතුව	**7,170.00**	**8,418.71**

24 **ගෙවියයුතු**

ණයහිමියෝ	64,525,120.34	66,532,345.03
කොන්ත්‍රාත්කරුවන්ගේ රදවාගත් මුදල්	11,780,517.03	5,815.796.34
අනිකුත්	1,162,827.26	2,133,581.27
	77,468,464.63	**74,481,722.64**

25	තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්		2018	2017
	අත්තිකාරම් ලැබීම්		15,579,328.80	8,670,400.00
	සේවක ආරක්ෂිත තැන්පතු		61,500.00	49,500.00
	ගණුදෙණු කරුවන්ගේ අත්තිකාරම්		15,896.26	15,896.26
	සේවකයන්ගේ වැඩිපුර අයකර ගැනීම්		8,872.92	1,250.00
	ඉඩම් ආරවුල් තැන්පතු		78,151,108.41	66,465,090.70
	ටෙන්ඩර් තැන්පතු		8,875,700.00	8,165,500.00
	ලෝක වෙළද මධ්‍ය. වෙළද කුටි රදවා ගැනීම්		32,737,771.02	19,185,291.07
	මැණික් කෞතුකාගාර අරමුදල		125,997.00	125,997.00
	නිර්යාත කොමිස් තැන්පතු		280,000.00	280,000.00
			135,836,174.41	**102,958,925.03**
26	**ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ**			
	සංස්ථාපිත බදු	(සටහන් 26.1)	22 ,361,874.12	24,732,960.86
	එකතුකල අගය මත බදු		1,020,703.16	9,978,712.84
	රදවාගත් බදු		30,085.27	7,000.00
	රදවාගත් මැණික් වෙනදේසි බදු 2.5%		162,991,516.32	115,618,538.35
	ආර්ථික සේවා ගාස්තු		-	-
	ජාතිය ගොඩනැගීමේ බදු		(2,131.58)	1,853,811.69
	මුද්දර ගාස්තු		455,427.82	1,945,252.43
	උපයනවිට ගෙවීමේ බදු		94,867.00	(364,185.33)
			186,952,342.11	**153,772,090.84**

26.1 සංස්ථාපිත බදු

ජනවාරි 01 දිනට ශේෂය	19,017,039.14	32,111,087.13
වර්ෂය සදහා වර්ථන බදු	54,463,728.23	7,211,837.13
වර්ෂයතුල ගෙවීම් - පසුගිය වසර බැදීම් පියවීම	-	-
ස්ව තක්සේරු ගෙවීම්	-	(1,000,000.00)
බදු බැර පියවීම් - ආර්ථික සේවා ගාස්තු	-	(2,385,319.00)
- රදවාගත් බදු	(2,158,668.11)	-
- ජාතික බදු	(759,750.00)	-
පසුගිය වර්ෂය සදහා වු අඩි/(ඌණ) වෙන්කිරීම් මත ගැලපීම	(48,200,475.14)	(16,920,566.95)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**22,361,874.12**	**19,017,039.14**

27 වෙන්කිරීම් සහ උපචිත වියදම්

නීති වියදම් සඳහා ප්‍රතිපාදන	-	-
උපචිත වියදම්	80,584,482.86	61,285,780.22
	80,584,482.86	**61,285,780.22**

28 ආදායම්

	2018	**2017**
ඉඩම් වෙන්දේසි - රජයේ ඉඩම්	24,570,634.88	15,318,280.05
ඉඩම් වෙන්දේසි - ඉඩම් ප්‍ර.කොමි.	15,966,092.43	8,959,330.71
සේවා සහ බලපත්‍ර අභියාචන ගාස්තු	1,233,944.00	1,230,625.11
මැණික් ගැරීමේ බලපත්‍ර ගාස්තු	34,836,829.35	30,626,717.64
වෙළඳාම් බලපත්‍ර ගාස්තු	49,161,290.74	47,430,740.77
ත්‍යාග සහ සාම්පල් සඳහා සේවා ගාස්තු	364,000.00	500,550.00
මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත සේවා ගාස්තු	134,417,091.77	133,279,740.77
මැණික් කැපීමේ බලපත්‍ර ගාස්තු	365,550.00	283,037.06
ගෙවුඩ නිර්යාත සේවා ගාස්තු	3,981,642.19	8,519,859.68
LDO ඉඩම් සහ ඛණිජ බද්ද	4,305,544.00	3,664,500.00
දඩ මගින් ආදායම්	17,323,474.67	28,992,516.41
මැණික් වෙන්දේසි බලපත්‍ර	1,024,800.00	935,700.00
මැණික් පරීක්ෂා කිරීමේ ගාස්තු	10,550,540.81	7,357,114.88
තත්ත්ව මුද්‍රා කාර්යාලයේ ආදායම්	26,893,935.50	8,520,024.27
බලපත්‍ර පිටපත් ගාස්තු	145,281.60	161,178.90
කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු	6,308,034.65	4,565,852.79
මැණික් පාර්සල් නිශ්කාශණයෙන් ආදායම්	1,073,000.00	1,269,250.00
පාරිසරික ආරක්ෂණය	565,000.00	600,000.00
BACO සේවා ගාස්තු	14,791,599.98	3,637,197.46
පරීක්ෂණ ගාස්තු	20,643,208.18	7,190,363.64
ත්‍රීමාන කාඩ් සහ වර්ණ	2,850,780.00	2,718,105.00
මැණික් වෙළඳාම	25,929,373.02	126,781,569.62
මැණික් ගැරීමේ දඩ	5,577,000.00	6,795,200.00
බොරළු ප්‍රවාහන බලපත්‍ර ගාස්තු	1,324,600.00	3,300,000.00
	404,203,247.77	**452,637,454.22**

29	අනිකුත් ආදායම්	2018	2017
	විවිධ ආදායම්	1,108,598.12	744,092.48
	ලෝක වෙළද මධ්‍යස්ථානයේ සහ රත්නපුර වෙළඳසැල්	36,076,531.98	29,883,775.94
	පොත් අලෙවිය	14,400.00	12,300.00
	ලාභාංශ	1,991,086.87	1,294,649.73
	කුලී ආදායම්	1,771,737.69	1,713,271.06
	වෙන්දේසි අයිතම වලින් ලද මුදල්	2,669,900.00	-
	ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභ	78,100.00	42,569.15
	රක්ෂණ නියෝජිතායතන වලින් ලද ආදායම්	305,428.68	299,219.66
	ස්වර්ණාභරණ අලෙවිය	-	796,945.00
	ප්‍රදර්ශනන වියදම් - විදේශීව (අයකරගැනීම)	12,113,911.70	47,924,168.05
		56,129,695.04	**82,710,991.07**

30	පරිපාලන වියදම්	2018	2017
	දායක මුදල්	1,013,470.27	596,493.60
	සංග්‍රහ වියදම් - (දේශීය)	1,762,153.58	582,811.66
	දුරකථන ගාස්තු	4,817,419.25	5,380,750.69
	තැපැල් හා මුද්දර	974,344.39	1,921,342.08
	අන්තර්ජාල ගාස්තු	2,758,814.96	2,770,641.71
	ටෙලෙක්ස් සහ ෆැක්ස් ගාස්තු	870.00	1,435.10
	අධ්‍යක්ෂ මණ්ඩල වියදම්	1,138,000.00	995,000.00
	කුලී	14,157,212.08	14,680,017.71
	විදුලිය	9,222,871.97	10,704,102.46
	වරිපනම් සහ බදු	1,565,405.68	1,411,126.75
	පුවත් පත් සහ වාර සඟරා	215,860.00	199,639.00
	ජල ගාස්තු සහ බදු	1,339,817.68	1,426,649.45
	ප්‍රචාරක	1,492,465.00	883,427.50
	ප්‍රවාහන	405,954.84	848,389.34
	රක්ෂණය	1,675,310.47	1,712,729.14
	නීති වියදම්	859,114.21	1,212,845.072

වර්ෂය සඳහා විගණන ගාස්තු	900,000.00	600,000.00
මිනින්දෝරු ගාස්තු	112,444.43	672,580.00
කළමනාකාරිත්ව උපදේශක ගාස්තු	491,250.00	43,700.00
ගොඩනැගිලි නඩත්තු	6,670,667.89	8,861,304.47
උපකරණ නඩත්තු	3,280,734.48	4,233,142.66
ආරක්ෂක සේවා	8,385,000.00	8,945,750.00
වැඩමුළු සහ පුහුණු (දේශීය)	1,104,765.95	2,814,294.82
වැඩමුළු සහ පුහුණු (විදේශීය)	-	1,625,485.11
වැටලීම් වියදම්	620,433.00	603,800.02
සාමාන්‍ය වෙන්දේසි වියදම්	343,850.00	837,026.46
පරිත්‍යාග	554,000.00	601,785.00
පාරිභෝගික වත්කම්	58,839.00	267,642.36
කාර්යාල මිලදී ගැනීම්	2,921,204.39	3,959,437.40
භාවිත ඉඩම් අයිතියේ ක්‍රමක්ෂය	2,364	2,364.00
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	2,451,407.43	4,471,512.10
පරීක්ෂණාගාර සැපයුම්	779,469.00	593,790.60
පාරිසරික වියදම්	1,581,894.00	1,035,408.00
ක්ෂවීම්	32,257,404.00	32,717,906.18
අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය	29,450.00	29,450.00
ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කුලී	28,434,675.00	24,932,088.59
ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ විදුලිය බිල	1,198,102.68	1,209,216.00
රථ වාහන නඩත්තු	6,157,461.50	6,613,711.53
ඉන්ධන සහ තෙල්	7,059,695.04	5,607,083.40
ටයර් සහ ටියුබ්	1,153,964.90	1,201,377.53
රථ වාහන රක්ෂණ සහ බලපත්‍ර	1,283,468.07	724,642.64
රථ වාහන නැවතුම් ගාස්තු	600.00	200.00
පොදු වියදම්	632,011.50	422,018.60
ව්‍යාපෘති වියදම්	10,137,203.48	23,387,757.77
බැංකු ගාස්තු	330,391.49	419,595.65
ඉල්ලුම් නොකල ජාතිය ගොඩනැගීමේ බදු	1,406,595.33	1,171,438.15
මැණික් ගරන්නන් සඳහා වු ශිෂ්‍යත්ව වියදම්	1,986,000.00	2,182,500.00
මැණික් ඉඩම් පුනරුත්ථාපනය	13,402,700.00	11,754,025.00
	179,127,130.94	**197,869,436.55**

31	**සේවක වියදම්**	**2018**	**2017**
	වේතන සහ දීමනා	117,344,761.13	107,327,141.43
	වැඩ බැලීමේ දීමනා/අවධානම් දීමනා	193,881.33	22,638.73
	සේවක අර්ථ සාධක යටතට නොගැනෙන වේතන	13,982,664.21	21,183,370.26
	සේවක අර්ථ සාධක අරමුදල	18,806,231.49	16,855,920.21
	සේවක භාරකාර අරමුදල	3,761,244.82	3,371,183.91
	අතිකාල	4,715,875.07	3,257,485.92
	නිවාඩු දින වැඩකිරීම සඳහා ගෙවීම	32,441.25	348,426.60
	ත්‍යාග (රන් පදක්කම්)	131,100.00	
	නිවාඩු ප්‍රසාද දීමනා	8,639,499.17	5,501,379.25
	සේවක නිවාස ණය පොලී ගෙවීම්	237,984.06	355,802.04
	සේවක දිරි දීමනා	18,087,612.57	30,885,760.07
	පාරිතෝෂික	1,722,598.00	7,814,363.00
	ගමන් වියදම් (දේශීය)	2,593,747.09	2,019,487.61
	කාර්ය මණ්ඩල නිල ඇඳුම්	984,159.69	71,558.75
	සේවක සුභ සාධන	14,130,235.23	13,883,302.58
	කම්කරු වන්දි	(1,700,000.00)	4,185,974.43
	වෛද්‍ය ගාස්තු	12,598,582.43	12,069,107.71
	ප්‍රවාහන දීමනා	13,887,500.00	8,457,000.00
		230,150,117.54	**237,609,902.50**

32	**ප්‍රවර්ධන වියදම්**		
	ගමන් වියදම් (විදේශීය)	429,100.00	6,067,092.00
	ප්‍රදර්ශන වියදම් (දේශීය)	6,899,656.16	8,677,396.85
	ප්‍රදර්ශන වියදම් (විදේශීය)	19,038,563.16	75,348,513.00
	ප්‍රචාරණය (දේශීය)	3,914,776.00	10,453,394.05
	ප්‍රචාරණය (විදේශීය)	550,004.26	946,520.72
	අනිකුත්	1,941,846.43	-
		32,773,946.18	**101,492,916.62**

33 **ශුද්ධ මුල්‍ය ආදායම්**

පොලී ආදායම්

ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත් මත පොලී	127,860,412.91	130,071,667.99
සේවක ණය පොලී	453,798.22	437,521.24
	128,314,211.13	**130,509,189.23**

පොලී වියදම්

කල් බදු ගෙවීම් බැරකම් මත වූ මුල්‍ය පිරිවැය	(38,239.00)	(38,027.00)
	(38,239.00)	**(38,027.00)**
	128,275,972.13	**130,471,162.23**

34 **ආදායම් බදු වියදම්**

වර්තමාන බදු වියදම්**(සටහන් 34.1)**	54,463,728.23	7,211,837.96
පසුගිය වසර සදහා (ඌණ)/ අධි වෙන්කිරීම් මත ගැලපීම්	-	-
විලම්භිත බදු ගාස්තු/ (වෙනස් කිරීම්) (සටහන් 6)	299,602.88	8,297,509.00
	54,763,331.11	**15,509,346.96**

34.1 වර්තන බදු වියදම් සහ ගිණුම් ලාභ ඉපයීම් අතර සැසදීම්	2018	2017
බදු වලට පෙර ගිණුම් ලාභ	**121,557,720**	**128,847,352**
ඉඩ නොදෙන අයිතමයන් එකතුව	65,125,775	147,105,672
ඉඩ දිය හැකි අයිතමයන් එකතුව	(32,698,962)	(70,182,825)
අනිකුත් ප්‍රභවයන්ගෙන් ආදායම්	(179,231,668)	(163,443,454)
වෙළද හෝ ව්‍යාපාරික කටයුතු වලින් ලාභ/ (පාඩු)	**(25,247,135)**	**42,326,745**
බදු සදහා අදාල අනිකුත් ආදායම් - පොලී ආදායම්	178,293,568	162,106,236.00
එකතු ව්‍යවස්ථාපිත ආදායම්	**178,293,568**	**204,432,981.00**
සුදුසුකම් ලබන ගෙවීම්	(29,490,077)	(204,432,981.00)
බදු පාඩු උපයෝජනය	(34,163,976)	-
තක්සේරුගත ආදායම්/ බදු අයකල හැකි	**114,639,515**	**-**

ආදායම්

ව්‍යවස්ථාපිත බදු රේටයවු 28% මත බදු ගාස්තු	32,099,064	-
බෙදිය හැකි ලාභ මත බදු	22,364,664	7,211,838.00
වර්ෂය සඳහා සාමන්‍ය කටයුතු මත වර්තනබදු	**54,463,728**	**7,211,838.00**

35. **ප්‍රාග්ධන සහ අනිකුත් බැදීම්**

වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ ප්‍රමාණාත්මක ප්‍රාග්ධන වියදම් හෝ අනිකුත් මුල්‍ය බැදීම් කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැත.ඇහැලියගොඩ ගොඩනැගිල්ල ඉදිකිරීමේ සංවර්ධනය සම්බන්ධ කෙරීගෙන යන වැඩ සඳහා වූ අන්තර් ගෙවීම් පරිගණක මෘදුකාංග පැකේජය සඳහා වු රුපියල් මිලියන 5.7 වටිනාකමින් ඉදිරියට ගෙවිම් ලෙස පෙන්වා ඇති මුදලින් 50% ක් වැඩ සම්පූර්ණ කර සහතික කර ඇත.

36. **වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසු ඇතිවන සිදුවීම්**

වාර්තා කරනු ලබන දෙසැම්බර් 31 දින සහ ගිණුම් අත්සන් කරන කාල පරිච්ඡේදය තුල ඉහත සඳහන් සිද්ධිය හැර ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට කාල පරිච්ඡේදයට පසු ඇතිවන සිදුවීම් නොමැත.

37. අසම්භාව්‍ය බැරකම්

අධිකාරියෙහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හේතුවෙන් පැන නගිනු ලබන නිත්‍යාණුකූල අසම්භාව්‍ය බැරකම් ඇත. වෙන්කිරීම් ලෙස හදුනාගෙන දක්වා තිබේනම් (සටහන් 27),
එම බැදීම් පියවා ඉවත් කිරීමේදී සම්පත් ඉවතට ගලායාම සහඑය සාධාරණීකරනය කලහැකි නම් කළමණාකාරීත්වය එය සැලකිල්ලට ගනු ලැබේ.
අධිකාරියෙහි නීති අංශයේ නීති උපදෙස් මත මෙම ගණනය කිරීම් රදා පවතිනු ඇත.

38. **සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම**

අධිකාරියෙහි සම්බන්ධිත පාර්ශවයන් මහා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධිත ආයතන, රජයට අයත් ව්‍යාපාරික ආයතන සහ ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයින් ගෙන් සමන්විත වේ.
මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත මගින් එකතු කර ගන්නා ලද අරමුදල් සහ ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය සමඟ එකතුව ලංකා ජෙමලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සාමාගම (Lanka Gemalogicla Laboratory (pvt) Ltd) පිහිටුවා ඇති අතර 2014 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු. 126,512,567 ක් විය.

38.1 ප්‍රධාන කළමනකරණ නිලධාරීන් හා සිදුවු ගණු දෙණු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 අනුව "සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම" ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්හට කෙලින්ම හෝ වක්‍රව ආයතනයේ කටයුතු කෙලින්ම හෝ වක්‍රව සැලසුම් කිරීම, මගපෙන්වීම්, පාලනය කිරීම් පිළිබද වගකීම පැවරී ඇත. ඒ අනුව ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස වර්ගීකරණය කෙරේ.

ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග සිදුවු ගණුදෙණු පහත දක්වා ඇත.	**2018**	**2017**
පාරිශ්‍රමික සහ අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	1,395,142	1,250,000
සේවා කාලයෙන් පසු ප්‍රතිලාභ	-	-

38.2 සම්බන්ධිත පාර්ශවයන් හා ගණුදෙණු

අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශවයන් හා සිදුකරන ලද ගණුදෙණු පිළිබද වැදගත් තොරතුරු පහත දක්වා ඇත.

සම්බන්ධිත පාර්ශවය	වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය සදහා කරන ලද ගණුදෙණුවල ස්වභාවය	ගණුදෙණුවේ වටිනාකම	ශේෂය (ගෙවිය යුතු) / ලැබිය යුතු
රජයට අයිති ව්‍යාපාරික ආයතන	ස්ථාවර සහතික වල සහ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය	316,637,270.80	
	ස්ථාවර සහතික සහ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගැනීම්	21,000,000	1,489,134,205
	ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO)	25,000.000	-
	ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) ආපසු ගැනීම්	-	25,000,000
අනිකුත් රජය හා සම්බන්ධිත ආයතන	කොටස්වල ආයෝජනය	-	-

39. පෙර වර්ෂය සඳහා ගැලපීම්

සංස්ථාපිත බදු අධි වෙන්කිරීම සහ 2016/ 2017 ගෙවිය යුතු උපයනවිට බදු ගෙවීම් පෙර වර්ෂය සඳහා වු ගැලපීම් යටතේ වාර්තා කර ඇත**.**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඑන්/ඩී/එන්ජීජේඒ/1/18 — ඔබේ අංකය / உமது இல. / Your No. } — දිනය / திகதි / Date } 2019 ජූනි 28 දින

සභාපති,

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ඉකුත් වර්ෂයේ සිදුකර තිබූ රු.48,200,475 ක ආදායම් බදු අධි වෙන්කිරීමක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 36 ඡේදය හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 80(ආ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ බදු වියදමට ගළපනු වෙනුවට පූර්ව වර්ෂ ගැලපුම් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 ට පටහැනිව, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් ලෙස දැක්විය යුතු පොලී ආදායම් ලැබීම් රු.3,884,687 ක් අඩුවෙන් හා ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ආපසු ගැනීම් හා නැවත ආයෝජනයන්වල මුදල් ගලා යාම් හා ඒම් අතර වෙනස වූ රු.295,637,270 ක් වූ ශුද්ධ අගය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. තවද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් ලෙස දැක්විය යුතු කෙරීගෙන යන වැඩ රු.61,890,191 ක් සහ ආපදා ණය ලබාදීම් රු.7,832,590 ක් ද, මුදල් ගලා ඒම් ලෙස දැක්විය යුතු ආපදා ණය ආපසු අයකර ගැනීම් රු.5,044,506 ක් ද, දේපල පිරියත උපකරණ හා සේවකයින්ගෙන් ලැබිය යුතු ශේෂ වලට එකතු කර දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.103,032,087 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති මෝටර් වාහන 26 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. මේ අනුව ගිණුම්කරණ ඇස්තමේන්තුවල පවතින දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව ප්‍රතිශෝධනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව සෑම වර්ෂයකදීම දේපල පිරියත හා උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්වල ඉදිරියට ගෙන යා යුතු වටිනාකම සමාලෝචනය කර ගිණුම්වලට ගැලපිය යුතු වුවත් එසේ සමාලෝචනය කිරීමකින් තොරව දේපල පිරියත හා උපකරණ, ලැබිය යුතු ශේෂ, තැන්පතු හා අත්තිකාරම් සහ වෙනත් වත්කම් සඳහා එකතුව රු.5,976,657 ක හානි කරන අලාභ සඳහා ගැලපීම් කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 ට පටහැනිව අසම්භාව්‍ය වගකීම් සඳහා සත්‍ය ඇස්තමේන්තුව නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව කම්කරු වන්දි වශයෙන් රු.5,800,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඊ) 2018 අප්‍රේල් 01 දිනෙන් පසු අදාල නොවන, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 61 වගන්තිය ප්‍රකාර රු.22,364,664 ක අතිරේක බදු වියදමක් ආදායම් බදු වියදම් යටතේ දක්වා තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ලාභය අඩුවෙන්ද බදු වගකීම වැඩියෙන්ද දක්වා තිබුණි.

(උ) (i) සප්ත වාර්ෂික නිවාඩු ලැබූ විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකු වූ අධිකාරියේ සභාපතිවරයා විශ්ව විද්‍යාලයෙන් සම්පූර්ණ වැටුප් හා දීමනා ලබමින් සිටියදී අධිකාරියෙන්ද එම සම්පූර්ණ වැටුප හා දීමනා ලබාගෙන තිබුණි.

2

(ii) සභාපතිවරයාට ආයතනයේ සභාපති ධුරය හෙබවීම වෙනුවෙන් 2017 ජූනි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 03/2015 ප්‍රකාරව රු.100,000 ක මාසික දීමනාවක් හා 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව රු.19,890 ක ඉන්ධන දීමනාවක් පමණක් හිමි වේ. ඒ අනුව 2017 දෙසැම්බර් සිට 2018 අප්‍රේල් දක්වා රු.542,657 ක් වැඩිපුර ගෙවා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙස් මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඇ) සහ (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත	
(i) 15(1) වගන්තිය	මැණික් කර්මාන්තය කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලධාරියා වන අධිකාරිය විසින් කිසිදු බලපත්‍රයක් රහිතව මැණික් ගැරීමේ ව්‍යාපෘති 3 ක් ක්‍රියාත්මක කරමින් පැවතුණි.
(ii) 15(2) වගන්ති	මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි.
(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
(i) 6.5.1 ඡේදය	අධිකාරියේ 2018 වර්ෂයේ මූල්‍ය වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2019 මාර්තු 26 දිනදීය.
(ii) 6.5.3 ඡේදය	2016, 2017 වර්ෂවල වාර්ෂික වාර්තා විගණිත දිනය වූ 2019 මැයි 15 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
(ඇ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
(i) 2 ඡේදය	සභාපතිවරයා වෙත නිල වාහනයක් ලබාදීම වෙනුවට සභාපතිවරයාගේ පෞද්ගලික වාහනය රාජකාරි සඳහා භාවිතා කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මසකට රු.200,000 බැගින් 2018 මැයි සිට මාස 08 ක කාලයක් සඳහා රු.1,600,000 ක මුදලක් ගෙවා තිබුණි. මීට අමතරව අධිකාරියේ සංචිත වාහනයක්ද සභාපතිවරයාගේ රාජකාරි සඳහා යොදවා 2018 ජූනි සිට දෙසැම්බර් දක්වා කිමී.12,838 ක් ධාවනය කර තිබූ අතර එහි ධාවන සටහන්වල භාවිත කල නිලධාරියා අත්සන් කර නොතිබුණි.

(ii) 3.2 ඡේදය	සභාපතිවරයාට 2018 අගෝස්තු 31 සිට මාස 4 ක කාලය තුල සැපයූ අතිරේක ඉන්ධන සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය රහිතව රු.256,857 ක් ගෙවා තිබුණු අතර අනෙකුත් නිලධාරීන් සඳහා වර්ෂය තුල අවස්ථා 22 කදී සැපයූ අතිරේක ඉන්ධන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය රහිතව රු.241,409 ක් ගෙවා තිබුණි.
(ඇ) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 නොවැම්බර් 01 දිනැති අංක DMS/Policy/03 දරන ලිපිය	අනුමත තනතුරු 32 ක් සඳහා නව බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කර අනුමත කරගෙන නොතිබුණි.
(ඉ) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017 දෙසැම්බර් 26 දිනැති අංක DMS/1629/VolII දරන ලිපිය	අනියම් ක්ෂේත්‍ර සහකාරවරුන් ස්ථිර කිරීම භාණ්ඩාගාරය ප්‍රතික්ෂේප කර තිබුණද, ක්‍රියාකාරී මට්ටමේ නොතිබූ මැණික් ගැරීමේ ව්‍යාපෘතිවලට අනුයුක්ත කර සිටි අනියම් ක්ෂේත්‍ර සහායකයින් 15 ක් ස්ථිර කර තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 ට හා අයවැයට අනුකූලව පිළියෙල කර නොතිබූ අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 2018 ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඉටුකල යුතු ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, කතරගම නිවාඩු නිකේතනයක් ඉදිකිරීම හා ජාත්‍යන්තර මට්ටමේ මැණික් රසායනාගාරයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම යන කාර්යයන් වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 640 ක් රු.මිලියන 35 ක් හා රු.මිලියන 150 ක් වෙන්කර තිබුණද ඊට අදාල කිසිදු කාර්යයක් විගණිත දින තෙක් ආරම්භ කර නොතිබුණි. රත්නපුර දෙමුවාවක මැණික් විදිය ජාත්‍යන්තර මැණික් මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට රු.මිලියන 100 ක් වෙන්කර තිබුණද අදාලව ඉඩම් පවරා ගැනීම නිමකර සැලැස්ම ප්‍රකාර කාර්ය ආරම්භ කර නොතිබුණි.

(ඈ) මැණික් ගැරුම් ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව තෝරාගත් ආරක්ෂක සේවය ලබා නොගෙන හද්දුවවත්ත සහ බගවන්තලාව ව්‍යාපෘති සඳහා වෙනත් ආයතනයකින් ආරක්ෂක සේවාව ලබාගෙන පිළිවෙලින් මාස 8 ක් සඳහා රු.3,526,038 ක් ද, ගිවිසුමකට එළඹීමකින් ද තොරව මාස 16 ක් සඳහා රු.1,375,000 ක්ද ගෙවා තිබුණි.

(ඈ) 2018 සැප්තැම්බර් 10 නිම කිරීමට නියමිතව පැවති ඇහැළියගොඩ කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් විගණිත දින වූ 2019 මැයි 15 තෙක් නිමකර නොතිබුණු අතර ඉදිකිරීම් කාලය, විවිධ හේතූන් මත මාස 4 ½ කින් හා කිසිදු හේතුවක් හෝ අනුමැතියක්ද රහිතව මාස 4 කින්ද දීර්ඝ කර තිබුණි.

(ඉ) අධිකාරිය විසින් මැණික් ගැරුම් ව්‍යාපෘති හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සහ පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව මැණික් ගල්, ඉල්ලම් හා මැණික් ඉඩම් වෙන්දේසි සිදුකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු නොකරන අතර ඒ සඳහා වෙනත් මාර්ගෝපදේශයක් අනුමත කරගෙනද නොතිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) පුරප්පාඩුව පැවති විධායක ශ්‍රේණිවල තනතුරු 04 ක රාජකාරී ආවරණය කිරීම සඳහා වෙනත් නිලධාරීන් පත්කර තිබූ අතර ඒ සඳහා ස්ථිර නිලධාරීන් බඳවාගෙන නොතිබුණි.

(ආ) පනත මගින් අධිකාරිය වෙත පැවරුණු ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය, ප්‍රවර්ධනය හා නියාමනය සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

ස්වර්ණාභරණ කර්මාන්තය නියාමනය සඳහා ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් ලියාපදිංචි කරවීම, ලියාපදිංචිය අලුත් කිරීම හා පසු විපරම් කිරීම සඳහා අධිකාරියේ මැදිහත් වීම අවම මට්ටමක විය.

(ii) එම කර්මාන්තකරුවන්ගෙන් රු.5,000 ක වාර්ෂික ලියාපදිංචි ගාස්තුවක් අයකර 2008 වර්ෂයේ ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල පිහිටුවා තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබූ අතර අරමුදලේ අරමුණු නිශ්චිතව දක්වා නොතිබුණි.

(iii) කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් එකී අරමුදල භාවිතා කිරීමට නිශ්චිත සැලැස්මක් හෝ ක්‍රමවේදයක් නොවූ අතර 2018 දෙසැම්බර් 31 දිනට රු.72,131,745 ක අරමුදල් ශේෂය නිෂ්කාර්යව තබා තිබුණි.

(iv) 2017 හා 2018 වර්ෂවලදී අරමුදල භාවිත කර රු.4,213,289 ක උපකරණ හා වත්කම් ස්වර්ණාභරණ සංගමයක් වෙත පරිත්‍යාග කර තිබුණද, ඒවා ඌන උපයෝජිතව පැවතීමෙන් උපකරණ ලබාදීමේ අරමුණු ඉටුවී නොතිබුණි. තවද, අරමුදල භාවිත කර සිදුකල පරිත්‍යාග වලින් කර්මාන්තය සඳහා වූ දායකත්වය අවම මට්ටමක පැවතුණි.

(ඈ) ජලජීවී වගා සංවර්ධන අධිකාරියට අයත් උඩවලව මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ ඉල්ලම් ඉවත් කර ගැනීම සඳහා එම අධිකාරිය සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අතර ඇති කරගෙන තිබූ ගිවිසුමට පටහැනිව හා ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියක් නොමැතිව අධිකාරිය විසින් ව්‍යවසායකයෙකු සමඟ එළඹි ගිවිසුමක් මත එකී භූමිය භාරා මැණික් ගැරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියෙන් ලැබුණු මැණික් වර්ග සහ ප්‍රමාණ පිළිබඳව ගැරුම් අවස්ථාවේ තබා ඇති සටහන් සහ මැණික් තක්සේරුවේදී තබා ඇති සටහන් අතර දැඩි විෂමතාවක් පැවතුණ අතර තක්සේරු කමිටුව විසින් ඉවත් කල ක්‍රෑත් 88.65 ක් වූ මැණික් ගල්වල වර්ගය, කැබලි සංඛ්‍යාව ඉවත් කල ආකාරය, ඉවත්කිරීමට හේතු හා අනුමැතිය දක්වා නොතිබුණි.

(ඇ) කළුගඟ හැරනියාවක මැණික් ගැරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 12.5 කට ව්‍යවසායකයෙකු 2017 අගෝස්තු 11 දින තෝරාගෙන තිබුණද එම ස්ථානයේ මැණික් ගැරීම සඳහා පරිසර නිර්දේශය සහ අනිකුත් රාජ්‍ය ආයතන වෙතින් ලබාගත යුතු අනුමැතීන් ලබා ගැනීමට අසමත් වීම හේතුවෙන් ව්‍යාපෘතිය විගණිත දින තෙක් ආරම්භ කර නොතිබුණි.

(ඉ) කැළණි ගඟ ආශ්‍රිතව අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන හද්දුවවත්ත මැණික් ගැරුම් ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. ව්‍යාපෘතිය හේතුවෙන් ගඟේ ඉවුරු දැඩි ලෙස බාදනයට ලක් වී තිබුණද ඒවා යථාවත් කිරීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ව්‍යවසායකයාගෙන් ඇප මුදල් ලබාගෙන ද නොතිබුණි. ව්‍යාපෘතියෙන් ලැබුණු මැණික් ගල් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 4 කදී වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමේදී බර ක්‍රෑත් 1,858.65 ක් වූ මැණික් ගල් වටිනාකමක් නොමැති ගල් ලෙස සඳහන් කර ඉවත් කර තිබූ අතර එම ගල් වර්ග, කැබලි සංඛ්‍යාව, ඉවත් කිරීමට හේතු හා ඉවත් කල ආකාරය සහ අනුමැතිය වාර්තා කර නොතිබුණි.

(ඊ) අධිකාරියේ අපනයන අලෙවි සහ ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් වූ ප්‍රවර්ධන සැලැස්ම ප්‍රකාරව රු.28,000,000 ක් වැයකර පැවැත්වීමට සැලසුම් කර තිබූ දේශීය ප්‍රදර්ශන 3 ක් සහ විදේශ ප්‍රදර්ශන 3 ක් පවත්වා නොතිබූ අතර රු.3,690,000 ක් වැයකර සැලැස්මෙහි ඇතුලත් නොවූ විදේශීය ප්‍රදර්ශන 3 ක් පවත්වා තිබුණි. විදේශීය ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගී කර ගැනීමට හා දායකත්වය ලබා ගැනීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් නොවීම හේතුවෙන් ප්‍රදර්ශන 2 කට අදාල රු.2,815,000 ක සම්පූර්ණ වියදම හා ප්‍රදර්ශන 4 කට අදාලව අපනයනකරුවන් ලබා දිය යුතු රු.3,426,163 ක දායකත්වය අධිකාරියෙන් දරා තිබුණි.

(උ) ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) අධිකාරියේ ප්‍රධාන අරමුණු වූ රන් ආනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරුව සඳහා පහසුකම් සැලසීම හා ප්‍රවර්ධනය, රත්නදීප වෙළඳකුටිය මෙහෙයවීම හා කළමනාකරණය යන කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට හා එකී අරමුණු ඉටු කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ii) වර්ෂය තුල ඉටුකල යුතුව තිබූ පරිසර සංරක්ෂණ වැඩසටහන් පැවැත්වීම, මැණික් හා ස්වර්ණාභරණ ප්‍රවර්ධනය හා ප්‍රති අපනයනය යටතේ විදේශීය රටවල් සම්බන්ධ කරගෙන ඉටුකල යුතු ක්‍රියාකාරකම් 5 ක්, මැණික් වෙළඳපලක් පිහිටුවීම, ප්‍රධාන කාර්යාලයේ පිහිටි රසායනාගාරය හා තක්සේරු රසායනාගාරය උසස් කිරීම, නුවර නව රසායනාගාර 2 ක් පිහිටුවීම, අධිකාරිය සඳහා ISO ප්‍රමිති සහතිකයත්, ස්වර්ණාභරණ තක්සේරු අංශය සඳහා ජාත්‍යන්තර සාමාජිකත්වය හා ජාත්‍යන්තර සහතිකයත් ලබා ගැනීම, මැණික් හා ස්වර්ණාභරණ සඳහා අන්තර්ජාල වෙන්දේසි ක්‍රමය හඳුන්වාදීම යන කාර්යයන් සඳහා රු.326,938,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද එම කාර්යයන් වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ නියැලි කර්මාන්තකරුවන් ඇගයීම සඳහා රු.10,000,000 ක් ප්‍රතිපාදනය කරගෙන ක්‍රියාකාරී සැලැස්මටද ඇතුලත් කර තිබුණද එම උපයෝජනය නොකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින්ද තොරව කර්මාන්තයේ නියැලි ව්‍යාපාරිකයන්ගෙන් රු.15,850,000 ක දායක මුදලක් ලබාගෙන අධිකාරියේ රජත ජයන්ති උත්සවයද සමඟ කර්මාන්තකරුවන් ඇගයීමේ සම්මාන උළෙලක් සංවිධානය කර තිබුණි. උත්සවය 2018 නොවැම්බර් 23 දින පවත්වා තිබුණද අදාල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා 2018 දෙසැම්බර් 14 දින ආවරණ අනුමැතිය ලබාදී තිබුණි. රජත ජයන්ති සම්මාන උළෙල සඳහා සියලු භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4(ආ) ට පටහැනිව වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය යටතේ ලබාගෙන තිබුණි. සම්මාන උළෙල සඳහා අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් කුසලාන 21 ක් සකස් කරගෙන තිබූ අතර ඉන් රු.183,600 ක් වූ කුසලාන 17 ක් නිශ්කාර්යව තබා තිබුණි.

(එ) 2012 වර්ෂයේ රු.8,950,000 කට මිලදී ගත් මෝටර් රථයක් 2017 දෙසැම්බර් දක්වා කි.මී.105,502 ක් පමණක් ධාවනය කර වර්ෂයකට අධික කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි. වාහනය භාවිත කල වර්ෂ 6 ක කාලය තුල රු.4,542,832 ක් වැයකර අලුත්වැඩියාවන් 55 ක් සිදුකර තිබුණි.

(ඒ) කටුනායක ගුවන් තොටුපල පිටවීම් පර්යන්තයේ ස්ථාපිත අපනයන සේවා මධ්‍යස්ථානයේ අපනයනිත මැණික් හා ස්වර්ණාභරණ පාර්සල් මුද්‍රා තැබීම සඳහා රු.1,242,000 ක් වැයකර මිලදී ගත් පොලිතීන් බෑග් 10,000 කින් 9,740 ක් හා ආරක්ෂිත පටි සහ ස්ටිකර් 40,000 කින් 39,740 ක් වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ නිෂ්කාර්යව තබා තිබූ අතර අපනයන මධ්‍යස්ථානය වසා දමා තිබුණි.

(ඔ) රු.මිලියන 13.6 කට අධික වියදමක් දරා 2017 වර්ෂයේ ස්ථාපිත කර තිබූ ජංගම රසායනාගාරයෙන් 2018 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා මාස 10 ක කාලය තුල සහතිකපත් 425 ක් නිකුත් කර රු.380,180 ක් උපයා තිබුණි. ඊට අදාල සෘජු වියදම රු.641,352 ක් හා ක්ෂය වෙන් කිරීම රු.2,844,609 ක් වීමෙන් සමස්ථ ඌණතාවය රු.3,105,823 ක් වී තිබුණි. මෙම ජංගම රසායනාගාරය සඳහා 2016 වර්ෂයේ මිලදී ගත් රු.99,395 ක් වූ පරිගණකයක් හා රු.7,794,888 ක් වූ Energy Dispersine X Ray Fluorescence Spectrometer උපකරණ 2 ක් වර්ෂ 2 කට වැඩි කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව තබා තිබුණි.

(ඕ) අධිකාරිය සතු මාතර බෙලිදෙණිය ප්‍රදේශයේ පිහිටි වටිනාකම රු.889,000 ක් වූ පර්චස් 80 ක ඉඩමක් හා එහි පිහිටි ලියාභල අගය රු.3,091,861 ක් වූ වර්ග අඩි 3,007 ක ගොඩනැගිල්ලක් 2012 වසරේ සිට වසර 7 කට වැඩි කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි.

(ක) රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ පිහිටුවීමට යෝජිත කෞතුකාගාරයක් වෙනුවෙන් 2016 වර්ෂයේ මිලදීගත් රු.1,251,498 ක් වූ වත්කම් වර්ෂ 2 කට වැඩි කාලයක් තිස්සේ නිෂ්කාර්යව තබා තිබූ අතර විගණිත දින තෙක් කෞතුකාගාරය ආරම්භ කර නොතිබුණි.

(ග) අධිකාරියේ නීති අංශයේ නීතිඥයින් 5 ක් සේවය කරමින් සිටින අතර විවිධ පාර්ශව විසින් අධිකාරියට විරුද්ධ පවරා තිබූ නඩු 30 කින් 26 ක් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය ලබාගැනීම වෙනුවෙන් රු.859,114 ක් ගෙවා තිබුණි.

(ච) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත්වී තිබුණද ඊට අදාල කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති